# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

# 2016

**කලයාණී දහනායක**

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

## 2016 වසර තුළ කාර්යසාධන සාරාංශය

2016 වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 641,547 ක් වූ අතර, එය කලින් වසරට වඩා රුපියල් මිලියන 81,124 ක හෙවත් සියයට 14.4 ක වැඩිවීමක් පෙන්වයි. එමගින් රජයේ සමස්ත ආදායමට සියයට 38.02 ක දායකත්වයක් ලබාදුන් අතර, වසර තුළ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සියයට 5.42 ක් විය.

බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමේ සහ සවිබල ගැන්වීමේ ක්‍රියාමාර්ග යන්ගෙන් සමන්විත ඒකාබද්ධ යාන්ත්‍රණයෙහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිරත විය.

බදු ගෙවන්නන් විසින් රජයේ ආදායමට දක්වන ලද මා හැඟි දායකත්වය හඳුනාගනිමින් ඔවුනට වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමේ පැසසුම් ක්‍රියාවලිය වර්ෂය තුළ දී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදි.

අනෙක් අතට, බදු විගණන, හෙළිදරව් නොවූ ආදායම සහ පිරිවැටුම විධිමත් කිරීම මගින් වසර තුළ දී රුපියල් මිලියන 300,962 ක මුදලක් බදු වශයෙන් අයකර ගැනීමට හැකි විය. ඒ මත පදනම්ව වසර තුළ දී අය කරන ලද අතිරේක බදු වටිනාකම රුපියල් මිලියන 33,562 ක් විය.

පැහැර හරින ලද බදු අයකර ගැනීමේ පනතට අතිරේක වශයෙන්, බදු අයකර ගැනීම සඳහා අදාළ ප්‍රඥප්තීන් හි දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පියවර අඛණ්ඩව ගෙන ඇත.

තොරතුරු අංශය, බදු සේවා අංශය, සෙසු අංශ සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ලබාදෙන ලද මූලික ක්‍රියාමාර්ග සමඟ අලුත් බදු ලිපිගොනු සැලකිය යුතු සංඛ්‍යාවක් විවෘත කර ඇත.

වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවේ නව්‍යකරණ වැඩ සටහන සමඟ පුළුල් පහසුකම් රැසක් සැලසීමට හැකිවන පරිදි බදු සේවා අංශය පූර්ණ නිපුනතාවයකින් යුතුව ශක්තිමත් කරන ලදි. ඒ අනුව, මීට පෙර විවිධ අංශ මගින් සිදු කරන ලද කවර වූ හෝ බදු වර්ගයක් ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සලසන ලදි.

ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ව්‍යාපෘතිය සහ විද්‍යුත් ලියාපදිංචි කිරීම යටතේ බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම වසර තුළ දී ආරම්භ කරන ලදි. බදු ගෙවන්නන් හට එ.අ.බ, ජා.ගො.බ, උ.වි.ගෙ, ර.බ. සහ සංස්ථා ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් සේවාව තුළින් පහසුකම් සලසන ලදි.

බදු ගෙවන්නන් සහ බදු උපදේශකයින් සඳහා දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් රැසක් අදාළ වසර තුළ දී පවත්වා ඇත.

## දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව පූර්ණ වශයෙන් පරිගණක ගත කරන ලද පද්ධතියකින් සමන්විත වූ බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ , ගෙවන්නා කෙරෙහි  බදු ත් වීමහිතෛෂී බදු පරිපාලකයෙක් බවට ප

## මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

## උපාය මාර්ග හා ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## ප්‍රධාන නිලධාරීන්

---

**කේ. දහනායක මහත්මිය** **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

### නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

---

| | |
|---|---|
| **ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා** | බදු පරිපාලනය (සංස්ථාපිත, විශාල සහ මධ්‍ය පරිමාණ) |
| **ඒ.එන්. ගුරුගේ මහතා** | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (සංස්ථාපිත, විශාල සහ මධ්‍ය පරිමාණ) |
| **පී. රෝහිණී මහත්මිය** | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන |
| **ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය** | අභියාචනා, විරුද්ධවීම, ණය කළමනාකරණය සහ නීති |
| **ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා** | මානව ප්‍රාග්ධන සහ වත්කම් පරිපාලනය |
| **ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මහත්මිය** | බදු ප්‍රතිපත්ති සම්පාදනය සහ අන්තර් ජාතික කටයුතු |
| **ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා** | තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පරිපාලනය සහ බදු මෙහෙයුම් සහාය |
| **එම්.ජී. සෝමචන්ද්‍ර මහතා** | බදු ආවේක්ෂණ, විමර්ශනය සහ මූලය බදු පරිපාලනය |
| **සී.එච්. වීරසිංහ මහතා** | බදු පරිපාලනය (සංස්ථාපිත, කුඩා පරිමාණ ආස්ථිත්වයන්) |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

---

| | |
|---|---|
| **එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය** | විගණන-විශාල ව්‍යාපාර ව්‍යවසායන් |
| **එස්. කරුණාරත්න මහත්මිය** | ස්වාධීන අභ්‍යන්තර කාර්යයන් පාලනය සහ බුද්ධි තොරතුරු |
| **ඕ.පී.පී.කේ. සිරිසේන මහතා** | බදු මෙහෙයුම් සහාය සහ ප්‍රසම්පාදනය හා සැපයුම් |
| **බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය** | මිල පැවරුම් නියෝග සහ පර්යේෂණ |
| **ඩී.බී. දිසානායක මහතා** | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (විශාල සංස්ථාපිත ව්‍යවසායන්) |
| **ඩී.ඩී.එන්.ජී. කෝරලේ ආරච්චි මහතා** | රඳවුම් බදු, උ. වි. ගෙ., මුද්දර ගාස්තු සහ ඔට්ටු හා සූදු බදු |
| **ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා** | විගණන මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යවසායන් |
| **එම්.එස්.එම්. ෆුවාඩ් මහතා** | තොරතුරු සහ අන්තර් නියෝජ්‍යායතන |
| **පී.එල්.එස්. ලියනගේ මහතා** | අනුකූලතා සහාය සේවා සහ ප්‍රවර්ධනය |
| **ඒ.ඒ. දයාරත්න මහතා** | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම. (සංස්ථාපිත මධ්‍ය පරිමාණ ව්‍යවසායන්) |
| **ජේ. රත්නායක මහතා** | කලාප 1 සහ ඒකක 1 සහ 2 |
| **ඊ.එස්. ද සොයිසා මහතා** | පාරිභෝගික ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම |
| **එච්.එම.ඩබ්.සී. බණ්ඩාර මහතා** | කළාප III |
| **ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා** | මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය වෙනස්වීම සහ බදු ගිවිසුම්. |
| **ඩබ්.එම්.පී.එන්.බී. වනිගසේකර මහතා** | විශාල මධ්‍ය පරිමාණ සස්ථාපිත ව්‍යාපාර ව්‍යවසාය අරමුදල්. |
| **එම්.ජේ. ගුණසිරි මහතා** | විමර්ශනය |
| **ඩී. රන්ගල්ල මහතා** | සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන අභියාවන හා විරුද්ධවීම් සහ අභියාවන කොමිෂන් සභාව. |
| **ආර්.එම්. ජයසිංහ මහතා** | නීති සම්පාදනය ජාත්‍යන්තර හා අභ්‍යන්තර ආයතන සම්බන්ධ කටයුතු |
| **එම්.එච්. ඩෙන්සිල් මහතා** | කළාප II සහ ඒකක VIP සහ RTP |
| **යූ.බී. වක්කුඹුර මහතා** | මානව සම්පත් සහ වත්කම් කළමනාකරණය |
| **ජේ.ඒ.ජී. මහින්දරත්න මහතා** | නෛතික කටයුතු, පැහැර හරිනු ලබන බදු රැස්කිරීම සහ අභ්‍යන්තර විගණනය |
| **ඩී.එම්.පී.කේ. ගනේපොල මහත්මිය** | තොරතුරු තාක්ෂණය පරිපාලනය සහ ගෙවීම් පාලනය |

## වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ.

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බදු | 2007අංක 10, 2008 අංක 9 ,2009 අංක 19 2011 අංක 22, 2012 අංක 8, 2013 අංක 18, 2014 අංක 8 සහ 2015 අංක 9 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බදු, (මූල්‍යමය සේවා මත වූ එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11 සහ 2016 අංක 20 දරන පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තු | 2007අංක 15, 2008 අංක 11, 2009 අංක 16 , 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9 සහ 2015 අංක 13 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10, 2015 අංක 12 සහ 2016 අංක 21 පනත් මගින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 පනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගණුදෙනු බද්ද | 2005අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, 2006 අංක 11 දරන මුදල් පනත සහ 2008 අංක 08 දරන මුදල් පනත |
| සමාජ වගකීම් බද්ද | |
| ඉඩම් පැවරීම මත බද්ද | 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991අංක 52 දරන ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| ධන බද්ද මත අධිභාරය | 1982අංක 25 දරන ධන බද්ද අධිභාර පනත සහ 1989 අංක 8 දරන පනත |
| ආදායම් බදු මත අධිභාරය | 1984 අංක 12 දරන පනත සහ 1989 අංක 7 දරන පනත මඟින් සංශෝධිත 1982අංක 26 දරන අදායම් බදු මත අධිභාර පනත |
| හර බද්ද | 2003 අංක 05, 2008 අංක 12, 2009 අංක 17 සහ 2011 අංක 14 යන පනත් මගින් සංශෝධිත 2002 අංක 16 දරන හර බදු පනත |
| බූදල් බද්ද | සංශෝධිත පරිදි 1980 අංක 13 දරන බූදල් බදු පනත |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | සංශෝධිත පරිදි 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත |

## පටුන


**2015** **වසර තුළ කාර්ය සාධන සාරාංශය** **III**
**ප්‍රධාන නිලධාරීන්** **VII**

**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු** **IX**

**පටුන** **XI**

**I කොටස - මානව සම්පත් කළමනාකරනය සහ සංවර්ධනය** **1**

පරිච්ඡේදය 1 මානව සම්පත් 3
1.1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව 5
1.2 උසස් කිරීම් 6
1.3 විශ්‍රාම ගැනීම් 6
1.4 පුහුණු කිරීම 6

**II කොටස - බදු පරිපාලනය** **11**

පරිච්ඡේදය 2 ආදායම් රැස්කිරීම 13
2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව 15
2.2 මුළු ආදායම් රැස්කිරීම 15
2.3 මුළු ආදායම් ප්‍රවාහය 17
2.4 ආදායම පෙර වසර සමඟ සැසඳීම 18
2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම 19
2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම් 19
2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය 20
2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය 21
2.9 ආදායම් බදු රැස්කිරීම 22
2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම. 24
2.11 ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රැස්කිරීම් 28
2.12 ආර්ථික සේවා ගාස්තු (ESC) රැස්කිරීම 29
2.13 උපයන විට ගෙවීමේ බදු (PAYE) රැස්කිරීම 30
2.14 රඳවා ගැනීමේ බදු (WHT) (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) 30
2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම 31
2.16 රථ වාහන හිමිකම් බද්ද 31
2.17 මුද්දර බදු රැස්කිරීම 31
2.18 ඉඩම් පැවරීම මත බදු 32
2.19 දේශීය ආදායම් රැස්කිරීම 2012 සිට 2016 දක්වා (බදු වශයෙන්) 32

පරිච්ඡේදය 3 වියදම් සහ ඵලදායිතා අනුපාතය 35
3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2014, 2015 සහ 2016 වර්ෂ සමඟ සැසඳීම 37
3.2 ඵලදායිතා අනුපාතය 38
3.3 අභ්‍යන්තර විගණනය 39

පරිච්ඡේදය 4 පැහැර හරින ලද බදු 41
4.1 පැහැර හරින ලද බදු 42
4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම් 43
4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම. 43

පරිච්ඡේදය 5 විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා 45
5.1 විගණන 47
5.2 අභියාචනා 48
5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන 48
5.4 අය ක්‍රියා මාර්ග 48
5.5 ආපසු ගෙවීම් 49

පරිච්ඡේදය 6 ජාත්‍යන්තර සබඳතා 51
6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් 53
6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන් 55

පරිච්ඡේදය 7 ව්‍යවස්ථා සම්පාදනය 59
7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන් 61
7.2 අනුමත පුණ්‍යායතන 61
7.3 ගැසට් නිවේදන 61
7.4 අර්ථ නිරූපණ කමිටුව 62

පරිච්ඡේදය 8 අනෙකුත් කාර්යයන් 63
8.1 බදු සේවා අංශය 65
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර 65
8.3 මිල පැවරුම් නියෝග අංශය 65
8.4 පුහුණු අංශය 66

පරිච්ඡේදය 9 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 67

# කොටස I

# මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

# පරිච්ඡේදය 1

# මානව සම්පත්

**1.1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

| 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය | | | |
|---|---|---|---|
| **තනතුර** | **අනුමත සංඛ්‍යාව** | **සේවයේ නිරත සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
| **දේශීය ආදායම් සේවය** | **1232** | **1193** | **42** |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 8 | 1 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 12 | 10 |
| කොමසාරිස් | 90 | 89 | 1 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් | 1110 | 1080 | 30 |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී / බදු නිලධාරී | - | 5 | - |
| **අනෙකුත් සේවා** | **1541** | **1360** | **183** |
| **ඒකාබද්ධ සේවය** | **1391** | **1272** | **119** |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | - |
| ගණකාධිකාරී | 5 | 5 | - |
| පරිපාලන නිලධාරී | 3 | 2 | 1 |
| භාෂා පරිවර්තක | 9 | 9 | - |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | - |
| පුස්තකාලයාධිපති | 2 | 1 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 925 | 834 | 91 |
| ප්‍රවාහන නිලධාරී | 1 | - | 1 |
| රියදුරු | 86 | 84 | 2 |
| කාර්යාල සේවක සේවය | 349 | 326 | 23 |
| **තොරතුරු සංනිවේදන තාක්ෂණ සේවය** | 131 | 72 | 59 |
| අධ්‍යක්ෂ (තොරතුරු සංනිවේදන තාක්ෂණ) | 1 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු සං. තාක්ෂණ) | 6 | 4 | 2 |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ නිලධාරී | 18 | 15 | 3 |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ සහකාර | 105 | 52 | 53 |
| **අනෙකුත්** | 19 | 16 | 5 |
| ඉංජිනේරු | 1 | 1 | - |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| පර්යේෂණ සහකාර | 10 | 10 | - |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | 1 |
| වඩු කාර්මික | 1 | - | 1 |
| සනීපාරක්ෂක කම්කරු | | 2 | - |
| **එකතුව** | **2773** | **2553** | **225** |

## 1.2 උසස් කිරීම්

- කොමසාරිස්වරුන් හතර දෙනෙකු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් නව දෙනෙකු කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- නියෝජ්‍ය කොමසාරිස්වරුන් එකොළෙස් දෙනෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- සහකාර කොමසාරිස්වරුන් එකසිය පනස් හය දෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුනි.

- කේ.ඒ.ජී. අබේරත්න මහතා - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- කේ. ධර්මසේන මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

- කොමසාරිස් - 02
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් - 01
- නියෝජ්‍ය කොමසාරිස් - 02
- සහකාර කොමසාරිස් - 04

**කේ.ඒ.ජී. අබේරත්න මහතා**

කේ.ඒ.ජී. අබේරත්න මහතා තක්සේරු නිලධාරියෙකු ලෙස 1981 දී දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූයේ ය. 2016.03.17 වන දින ඔහු විශ්‍රාම ගන්නා කාලවකවානුවේ දී නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියේ ය. දේශීය ආදායම් සේවයේ විවිධ තනතුරු හොබවමින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර වසර 35 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබිණි. ඔහුගේ ධූර කාලය තුළ 2004 වසරේ දී අමෙරිකා එක්සත් ජනපදයේ පැවති බදු විශ්ලේෂණ සහ ආදායම් පුරෝකථන වැඩ සටහන, 2007 වසරේ දී ඉන්දියාවේ පැවති විගණනය සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන, 2011 වසරේ දී ජපානයේ පැවති බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණ, 2014 වසරේ දී ඔස්ට්‍රියාවේ පැවති ගිවිසුම් සම්මුති සාකච්ඡා පිළිබඳ UN – OECD ප්‍රායෝගික වැඩමුළුව සහ 2015 වසරේ දී නෙදර්ලන්තයේ පැවති ඉහළ මට්ටමේ නිලධාරීන් සඳහා බදු පරිපාලනය පිළිබඳ වැඩමුළුව ඇතුළු විදේශ බදුකරණ වැඩසටහන් කිහිපයකට සහභාගි වූයේ ය. එසේම ඔහු 2012 වසරේ දී ප්‍රංශයේ පැවති එකතු කළ අගය මත බදු ලෝක සංසදයේ පළමු රැස්වීම මෙන්ම 2013 වසරේ දී රුවන්ඩාවේ පැවති 34 වැනි CATA තාක්ෂණික සම්මන්ත්‍රණය වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව නියෝජනය කළේය.

## 1.4 පුහුණු කිරීම

### 1.4.1 සේවාස්ථ පුහුණුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය අංශය විශේෂයෙන් ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව දැනුම ඉහළ නැංවීම සහ විශ්ලේෂණාත්මක හැකියාව ඔප්නැංවීම අපේක්ෂාවෙන් සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පුහුණු පාඨමාලාවන් සහ

විභාග නිරන්තරයෙන් පවත්වනු ලැබේ. නිලධාරීන් අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාගැනීම සඳහාත් අවශ්‍ය කෙරෙන විෂයය අරමුණු කොටගෙන මෙම පුහුණු පාඨමාලා සකසා ඇත.

වසර තුළ දී පුහුණු කරන ලද පිරිස් සහ පවත්වන ලද පරීක්ෂණ පිළිබඳ විස්තර පහත පරිදි දැක්වේ.

| පාඨමාලාව/පරීක්ෂණය | පුහුණු කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම් සඳහා II පංතියේ II ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු පන්ති | 514 | |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම් සඳහා II පංතියේ II ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු පංති | 36 | |
| II පංතියේ II ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පවත්වන ලද පරීක්ෂණය | පළමු ප්‍රයත්නය | 413 |
| II පංතියේ II ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පවත්වන ලද පරීක්ෂණය | පළමු ප්‍රයත්නය | 1 |
| II පංතියේ II ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පවත්වන ලද පරීක්ෂණය | දෙවන ප්‍රයත්නය | 35 |

- **සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදිය**

| විෂය | වසර තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු ගණන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| වෘත්තීය තක්සේරුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 70 |
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 96 |
| නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන් සඳහා බදු නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 1 | 25 |
| අලුතින් පත්කරන ලද සහකාර කොමසාරිස්වරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 3 | 390 |
| සහකාර කොමසාරිස්වරුන් සඳහා සම්මන්ත්‍රණය | 3 | 442 |
| මුද්දර ගාස්තු ප්‍රඥප්තිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළුව | 1 | 150 |
| අලුතින් බඳවා ගන්නා ලද කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව | 1 | 40 |

<u>පරිගණක ගත කරන ලද ගිණුම්කරණ පිළිබඳ පුහුණුව – පැකේජය (package)</u>

දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිව පරිගණක ගත කරන ලද ගිණුම්කරන පැකේජයට අදාළව පුහුණු වැඩසටහනක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 120 දෙනෙකු සඳහා AAT ආයතනයේ සහයෝගිත්වයෙන් පවත්වන ලදි.

### 1.4.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරීන්ගේ ඉහළ වෘත්තීය මට්ටම් පවත්වාගෙන යාම පිණිස වෙනත් රටවල බදු නීති පරිපාලනය සහ මනා පරිචයන්හි කරන ලද ප්‍රගමනයන්ට ඔවුන් නැඹුරු කරවීමේ අරමුණ පෙරදැරිව විදේශයන්හි පැවති පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා

සහභාගිවීමට ඉඩ සැලසෙන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු සලසා දෙන ලදි.

එසේ විදේශයන් සඳහා යවන ලද නිලධාරීන් සහ ඔවුන් සහභාගි වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩසටහන/සම්මන්ත්‍රණය/ වැඩමුළුව | පුහුණුව ලැබූ රට | කාලය |
|---|---|---|---|---|
| 01 | කේ. දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | OECD මිල පැවරුම් ප්‍රෙල්ඛනය සහ රටකින් රටකට වාර්තාකරණය (MTC event) | මැක්සිකෝව | 2016.09.24 – 2016.10.04 |
| 02 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු දිරි දීමනා කාර්යක්ෂමව සහ ඵලදායීව භාවිත කිරීම | මැක්සිකෝව | 2016.06.17 – 2016.06.25 |
| 03 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදුකරණය සහ තෙල් කර්මාන්තය, බදු ගෙවීම (TP) සහ අනෙකුත් බදු අවදානම් පිළිබඳ වැඩමුළුව | මැක්සිකෝව | 2016.11.26 – 2016.12.05 |
| 04 | ඒ..ඒ.ඩී.යූ. අබේසිංහ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | රජයේ සහ වගවීම පිළිබඳ වෘත්තීයමය සහතිකය | එක්සත් රාජධානිය | 2016.04.16 – 2016.04.25 |
| 05 | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදුකරණය සහ තෙල් කර්මාන්තය, බදු ගෙවීම (TP) සහ අනෙකුත් බදු අවදානම් පිළිබඳ වැඩමුළුව | මැක්සිකෝව | 2016.11.26 – 2016.12.05 |
| 06 | ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD බදු පරිපාලනය සැලසුම් මගින් අනුකූලතාවය (MTC Event) | හංගේරියාව | 2016.09.03 – 2016.09.10 |
| 07 | ඒ.ඒ. දයාරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD බදු පරිපාලනය සැලසුම් මගින් අනුකූලතාවය (MTC Event) | හංගේරියාව | 2016.09.03 – 2016.09.10 |
| 08 | බී.ඒ.ඩී.ඩී. හේරත් මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය සහ තෙල් කර්මාන්තය පිළිබඳ වැඩමුළුව - බදු ගෙවීම සහ අනෙකුත් බදු අවදානම් | මැක්සිකෝව | 2016.11.26 – 2016.12.05 |
| 09 | එම්.ජේ. ගුණසිරි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | රජයේ වගවීමේ වෘත්තීය සහතිකය | එක්සත් රාජධානිය | 2016.04.16 – 2016.04.25 |
| 10 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ඵලදායී සහ කාර්යක්ෂම බදු දිරි දීමනා භාවිතය | මැක්සිකෝව | 2016.06.17 – 2016.06.25 |
| 11 | ඩී.එම්.පී.කේ ගනේපොල මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා පදනම ක්ෂයවීම සහ ලාභ විතැන්වීම පිළිබඳ අන්තර්ගත කාර්ය රාමුව සම්බන්ධ කලාපීය රැස්වීම. | පිලිපීනය | 2016.11.28 – 2016.12.02 |
| 12 | ජී.එච්.එම් තිලකරත්න මහතා<br>කොමසාරිස් | ආදායම් බදු වැඩමුළුව. | කොරියාව | 2016.02.21 – 2016.02.27 |
| 13 | යූ.එල්.යූ.කේ. පෙරේරා මහතා<br>කොමසාරිස් | "විමර්ශන සහ බුද්ධි තොරතුරු රැස්කිරීමේ නවීන ක්‍රමවේද" සම්බන්ධ සිව් දින වැඩමුළුව සහ පුහුණු වැඩසටහන. | ඉන්දියාව | 2016.03.07 – 2016.03. 12 |
| 14 | ජී.ඩී.එස්. ජයරත්න මහතා<br>කොමසාරිස් | ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුව | කොරියාව | 2016.04.03 – 2016.04.09 |
| 15 | එස්.එම්.ඒ. බණ්ඩාර මහතා<br>කොමසාරිස් | LHDNM – OECD- BEPS සඳහා විගණන MNES - සිද්ධි අධ්‍යයනය. | මැලේසියාව | 2016.04.24 – 2016.04.30 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | වී.කේ.ඒ. තුසිතාංජලී මිය<br>කොමසාරිස් | OECD මිල පැවරුම් ප්‍රෙල්ඛනය සහ රටකින් රටකට වාර්තාකරණය (MTC Event) | මැක්සිකෝව | 2016.09.24 – 2016.10.04 |
| 17 | ජී.ඒ.ඕ. දයාවංශ මහතා<br>කොමසාරිස් | බදු සහ අපරාධ පිළිබඳ වැඩමුළුව | චීනය | 2016.10.29 – 2016.11.08 |
| 18 | එල්.ඩී.ආර්. ජයසේකර මහතා<br>කොමසාරිස් | බදු සහ අපරාධ පිළිබඳ වැඩමුළුව | චීනය | 2016.10.29 – 2016.11.08 |
| 19 | එම්.ඒ. ප්‍රියංකර මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ වැඩමුළුව. | චීනය | 2016.05.25 – 2016.06.16 |
| 20 | එච්.එස්.ජේ. රණසිංහ මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලාංකික නිලධාරීන් සඳහා 'සයිබර්' අපරාධ වැළැක්වීම සහ විමර්ශනය පිළිබඳ වැඩමුළුව. | චීනය | 2016.06.27 – 2016.07.17 |
| 21 | ටී.කේ.පී.බී. ඒකනායක මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | බදු පරිපාලකයින් පුහුණු කිරීමේ වැඩසටහන් හි පොදුරාජ්‍ය මණ්ඩලීය සංගමය. | එක්සත් රාජධානිය | 2016.07.22 – 2016.09.03 |
| 22 | එම්.කේ.පී.ජේ.එස්.එස්. පෙරේරා මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | බදු බලාත්මක කිරීම. | මැලේසියාව | 2016.10.08 – 2016.10.22 |
| 23 | එම්.එල්.ජේ.ජී. චන්ද්‍රසිරි මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව. | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 24 | ජේ.ඩී. ඕමන්ත මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ආදායම් බදු වැඩමුළුව. | කොරියාව | 2016.02.21 – 2016.02.27 |
| 25 | එන්.එම්.ඒ.කේ.බී. නාපාන මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | "විමර්ශන සහ බුද්ධි තොරතුරු රැස්කිරීමේ නවීන ක්‍රමවේද" සම්බන්ධ සිව් දින වැඩමුළුව සහ පුහුණු වැඩසටහන. | ඉන්දියාව | 2016.03.07 – 2016.03.12 |
| 26 | එම්.කේ.පී.ජේ.එස්.එස්. පෙරේරා මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | "විමර්ශන සහ බුද්ධි තොරතුරු රැස්කිරීමේ නවීන ක්‍රමවේද" සම්බන්ධ සිව් දින වැඩමුළුව සහ පුහුණු වැඩසටහන. | ඉන්දියාව | 2016.03.07 – 2016.03.12 |
| 27 | එම්.එන්.එම්.ඒ. කාඩර් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | IRBM – IBFD : ස්ථාවර ආයතන | මැලේසියා | 2016.04.17 – 2016.04.23 |
| 28 | එම්.එන්.එම්.ඒ. කාඩර් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | LHDNM – OECD : සැලසුම් මගින් අනුකූලතාවය - බදු අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා සාධන පත්‍ර. | මැලේසියා | 2016.11.20 – 2016.11.26 |
| 29 | ජේ.අයි.බී.එස්. උදයකුමාර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව. | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 30 | ජී.වී.පී. පෙරේරා මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 31 | එම්.පී.එම්. ලියනාරච්චි මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 32 | ඒ.ජී.එන්.පී. කුමාරිහාමි මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 33 | ආර්.එම්.එස්.එස්. රත්නායම මෙය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව | චීනය | 2016.10.10 – 2016.11.01 |

| | | | | |
|---|---|---|---|---|
| 34 | ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා පිළිබඳ 2016 වැඩමුළුව | චීනය | 2016.10.10 – 2016.11.01 |
| 35 | ජේ.එච්.එම්.ඒ. ජයපත්ම මහතා<br>සහකාර කොමසාරිස් | ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා පදනම ක්ෂයවීම සහ ලාභ විතැන්වීම පිළිබඳ අන්තර්ගත කාර්ය රාමුව සම්බන්ධ කලාපීය රැස්වීම. | පිලිපීනය | 2016.11.28 – 2016.12.02 |
| 36 | ඒ.සී. සිරිසෝම මෙනවිය<br>සහකාර කොමසාරිස් | මිල පැවරුම් සහ රටකින් රටකට වාර්තාකරණය පිළිබඳ ලෝක සබඳතා වැඩමුළුව. | කොරියාව | 2016.12.04 – 2016.12.11 |
| 37 | එස්.එස්.ඩබ්.පී.ඩී. රාජපක්ෂ මිය<br>සහකාර කොමසාරිස් | මිල පැවරුම් සහ රටකින් රටකට වාර්තාකරණය පිළිබඳ ලෝක සබඳතා වැඩමුළුව. | කොරියාව | 2016.12.04 – 2016.12.11 |
| 38 | ඩබ්.ඒ.ඩී.ඩී. වනිගසුන්දර මහතා<br>සහකාර කොමසාරිස් | බදු පරිපාලන තක්සේරු උපාංග (TADAT) පිළිබඳ පුහුණුව. | බංගලිදේශය | 2016.12.04 – 2016.12.11 |
| 39 | එම්.ඒ.ේජේ.ආර්. මුණසිංහ මහතා<br>සහකාර කොමසාරිස් | බදු පරිපාලන තක්සේරු උපාංග (TADAT) පිළිබඳ පුහුණුව. | බංගලිදේශය | 2016.12.04 – 2016.12.11 |
| 40 | ජේ.එම්.කේ.බී. ජයසුන්දර මහතා<br>සහකාර කොමසාරිස් | බදු පරිපාලන තක්සේරු උපාංග (TADAT) පිළිබඳ පුහුණුව. | බංගලිදේශය | 2016.12.04 – 2016.12.11 |
| 41 | ඩබ්.ඒ.එල්.එස්. විජේසිංහ මහතා<br>සහකාර කොමසාරිස් | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MPM) | කොරියාව | 2016.01.18 – 2017.01.22 |
| 42 | ඒ.ඒ.ඩී. හේමලතා මෙනවිය<br>සහකාර කොමසාරිස් | LHDNM – OECD : නිස්සාරක කර්මාන්තයේ මිල පැවරුම් අභිලාෂයන්. | මැලේසියාව | 2016.02.21 – 2016.02.27 |
| 43 | පි.කේ.ආර්. අශෝකා මෙනවිය<br>සහකාර කොමසාරිස් | LHDNM – OECD : නිස්සාරක කර්මාන්තයේ මිල පැවරුම් අභිලාෂයන්. | මැලේසියාව | 2016.02.21 – 2016.02.27 |
| 44 | ඒ.එල්.ඩී. සංජීව මහතා<br>සහකාර කොමසාරිස් | "විමර්ශන සහ බුද්ධි තොරතුරු රැස්කිරීමේ නවීන ක්‍රමවේද" සම්බන්ධ සිව් දින වැඩමුළුව සහ පුහුණු වැඩසටහන. | ඉන්දියාව | 2016.03.07 – 2016.03.12 |
| 45 | එම්.එල්.එස්.පී. ගුණතිලක මහතා<br>සහකාර කොමසාරිස් | බදු පරිපාලකයින් පුහුණු කිරීමේ වැඩසටහන් හි පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමය (ALT & LTAL) | එක්සත් රාජධානිය | 2016.07.22 – 2016.09.03 |

# කොටස II

# බඳු පරිපාලනය

# පරිච්ඡේදය 2
# ආදායම් ඇස්තමේන්තු කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය තුළ දී රු.641,546,766,081/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගිණුම් ගතවන සමාජ වගකීම් බද්ද, පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.) විවිධ බදු රැස්කිරීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු සංඛ්‍යාවේ එකතුව 2016.12.31 දින වන විට 1,382,204 ක්ව පැවතිණි.

## 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 01 වගුවෙහි දක්වා ඇත.

| **වගුව 01 - 2016.12.31 දිනට බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව.** | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| **සංස්ථාපිත** | | |
| වාසික සමාගම් | 43,992 | |
| නිර්වාසික සමාගම් | 1,997 | |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ආයතන | 49 | 46,038 |
| **සංස්ථාපිත නොවන** | | |
| තනි පුද්ගල | 119,332 | |
| හවුල් ව්‍යාපාර | 11,167 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 929 | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තයන් (2016.03.31) දිනට* | 1,051,364 | 1,182,792 |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | 1,228,830 |
| **අනෙකුත් බදු ගෙවන්නන්** | | |
| ආර්ථික සේවා ගාස්තු (ESC) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 4,090 | |
| එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 21,257 | |
| මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 216 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 97,438 | |
| මුල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 216 | |
| ඔට්ටු බදු ලිපිගොනු සංඛ්‍යාව | 563 | |
| සූදු බදු ලිපිගොනු සංඛ්‍යාව | 5 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | 123,785 |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 18,793 | |
| පොළිය මත රඳවාගැනීමේ බදු (රඳවාගැනීමේ නියෝජිතයන්) | 292 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවාගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 411 | |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 334 | |
| මුද්දර බදු (විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 9,759 | 29,589 |
| **2016.12.31 දිනට මුළු ලිපිගොනු/බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **1,382,204** |

## 2.2 මුළු ආදායම් රැස්කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 641,571 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 81,124 ක් හෙවත් 14.47% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම ඇතුළුව බදු අනුකූලතාවය වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ග හේතුකොටගෙන ප්‍රධාන වශයෙන් ම මෙම ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීමට හැකි විය. බදු ගෙවන්නන්ගේ බදු බැඳියාව තක්සේරු කිරීම හඳුනාගැනීම සහ බදු රැස්කිරීම කඩිනම් කිරීම තුළින් ඉහත සඳහන් කරන ලද වැඩිවීම කෙරෙහි මග පෑදිනි.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 38.05% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 111.94% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම රැස්කිරීම (මුලා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගණනය කරනු ලබන සමාජ වගකීම් බද්ද (SRL), පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) යටතේ එකතුවෙන් 1/3 ක් ඇතුළුව) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 105% ක් විය.

ආදායම් බදු රැස්කිරීම පෙර වසරේ වූ රුපියල් මිලියන 256,435 සිට රුපියල් මිලියන 238,398 දක්වා 25.14% කින් අඩු වී ඇත. (කලින් වසරේ ආදායම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එක් වරක් පමණක් අය කරන බද්දක් ලෙස 2015 අතුරු අයවැය මගින් හඳුන්වා දෙන ලද සුපිරි වාසි බද්ද ය.) කෙසේ වෙතත්, වසර සඳහා ඇස්තමේන්තු සසඳා බලන කළ ආදායම් බදු රැස්කිරීම 106.29% ක් ලෙස පිළිබිඹු වේ.


එකතු කළ අගය මත බදු රැස් කිරීම පෙර වසරට සාපේක්ෂව 24.42% කින් සහ නාමික අගයෙන් රුපියල් මිලියන 69,214 කින් වැඩි විය. එසේ වැඩි වීම සඳහා හේතුව බද්දට යටත් පිරිවැටුමේ සීමාව අඩු කිරීම සහ එකතු කළ අගය මත බදු අනුපාතය 15% දක්වා වැඩි කිරීම විය හැකිය.

2016 අයවැය යෝජනා මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය අනුව, ලාභ උපයන ව්‍යාපාර ආර්ථික සේවා ගාස්තු අය කිරීමෙන් බැහැර කිරීම ඉවත් කරන අතර අනුප්‍රමාණය වැඩි කිරීමට යෝජනා විය. ඒ අනුව, ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම පෙර වසරට සාපේක්ෂව සීඝ්‍ර ලෙස වැඩි වීමක් පෙන්වයි.

අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග යටතේ ආදායම සැසඳීමක් 02 වන වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන සටහනින් නිරූපණය කෙරේ. වසර තුළ මුදල් ප්‍රවාහය 03 වන වගුවෙහි දක්වා ඇති අතර එය 02 වන සටහනෙන් නිරූපණය කෙරේ.

**වගුව 02 - මුළු ආදායම රැස්කිරීම - 2016**


| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත) | ආදායම් රැස්කිරීම රු. | රැස්කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 224,300,000,000 | 238,398,610,641 | 106.29% | 37.16% |
| ආර්ථික සේවා ගාස්තුව | 21,000,000,000 | 20,458,175,363 | 97.42% | 3.19% |
| ඔට්ටු හා සූදු බද්ද | 900,000,000 | 1,884,498,652 | 209.39% | 0.29% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,900,000,000 | 737,659,559 | 38.82% | 0.11% |
| එකතු කළ අගය මත බද්ද | 270,000,000,000 | 283,451,513,780 | 104.98% | 44.18% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 1,585,883 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 16,639,038 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 8,091,2202 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 250,000,000 | 258,801,839 | 103.52% | 0.04% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 54,000,000,000 | 84,066,526,724 | 141.48% | 13.10% |
| මුද්දර බද්ද | - | 10,650,973,620 | - | 1.66% |
| ඉඩම් බද්ද | | 22,665,680 | | 0.00% |
| රථවාහන හිමිකම් බද්ද | 750,000,000 | 1,579,133,507 | 210.55% | 0.25% |
| සංචාරක බද්ද | 15,000,000 | 11,054,550 | 73.70% | 0.00% |
| සමාජ වගකීම් බද්ද | - | 836,043 | - | 0.00% |
| මුළු ආදායම් රැස්කිරීම | **573,115,000,000** | **641,546,766,081** | **111.94%** | **100.00%** |




සටහන 01
මුළු ආදායම් රැස් කිරීම - 2016

## 2.3 මුළු ආදායම් ප්‍රවාහන

| වගුව 03 - මුළු ආදායම් ප්‍රවාහය - 2016 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම් (ස.ආ.බ. ඇතුළුව)රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් රු. |
| ජනවාරි | 43,567,592,559.39 | 43,567,592,559.39 |
| පෙබරවාරි | 50,719,416,869.43 | 94,287,009,428.82 |
| මාර්තු | 39,576,585,752.21 | 133,863,595,181.03 |
| අප්‍රේල් | 49,448,211,096.70 | 183,311,806,277.73 |
| මැයි | 58,242,987,112.31 | 241,554,793,390.04 |
| ජුනි | 50,649,941,961.51 | 292,204,735,351.55 |
| ජූලි | 55,446,750,550.23 | 347,651,485,901.78 |
| අගෝස්තු | 57,426,971,701.13 | 405,078,457,602.91 |
| සැප්තැම්බර් | 66,926,504,173.36 | 472,004,961,776.27 |
| ඔක්තෝබර් | 54,332,672,892.10 | 526,337,634,668.37 |
| නොවැම්බර් | 69,435,401,124.27 | 595,773,035,792.64 |
| දෙසැම්බර් | 43,585,477,365.46 | **639,358,513,158.10** |





සටහන 02
ආදායම් ප්‍රවාහය - 2016

## 2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම

| බදු වර්ගය | 2016 ආදායම් රැස් කිරීම් රු. | 2015 ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බදු | 238,398,610,641 | 256,434,940,539 | -7.57 |
| ආර්ථික සේවා ගාස්තු | 20,458,175,363 | 6,148,447,689 | 69.95% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,884,498,652 | 831,922,843 | 55.85% |
| කොටස් ගනුදෙනු බද්ද | 737,659,559 | 1,394,916,707 | -89.10 |
| එකතු කළ අගය මත බද්ද | 283,451,513,780 | 214,236,985,4/84 | 24.42% |
| භාණ්ඩ හා සේවා බද්ද | 1,585,883 | 881,931 | 44.39% |
| පිරිවැටුම් බද්ද | 16,639,038 | 15,770,891 | 5.22% |
| ජාතික ආරක්ෂක බද්ද | 8,091,202 | 11,633,297 | -43.78 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 258,801,839 | 753,314,770 | -191.08 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 84,066,526,724 | 67,911,062,200 | 23.79% |
| මුද්දර බද්ද | 10,650,973,620 | 11,595,885,325 | -8.15 |
| ඉඩම් බද්ද | 22,665,680 | 1,066,637,564 | -4605.96 |
| රථවාහන හිමිකම් බද්ද | 1,579,133,507 | - | - |
| සංචාරක බද්ද | 11,054,550 | - | - |
| සමාජ වගකීම් බද්ද | 836,043 | 19,962,860 | -95.81 |
| **මුළු ආදායම් එකතුව** | **641,546,766,081** | **560,422,362,100** | **14.48%** |

**සටහන 03**
**පෙර වර්ෂය සමඟ ආදායම සැසඳීම**




## 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස්කරනු ලබන පහත සඳහන් බදු දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභාවලට මාරුකරන ලදි.

**ජාතිය ගොඩනැගීමේ බදු - මුළු එකතුවෙන්** **33.33%**

**මුද්දර ගාස්තු (බද්ද) - මුළු එකතුවෙන්** **100.00%**

දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස්කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 04 වන වගුවෙහි දැක්වේ.

| වගුව 04 - පළාත් සභාවලට බදු ආදායම් රැස්කිරීම් - 2016 | | | |
|---|---|---|---|
| | මුළු එකතුව රු. | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය රු. | % |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 84,066,526,724 | 26,642,388,365 | 33.33% |
| මුද්දර බද්ද | 10,650,973,620 | 10,650,973,620 | 100.00% |

## 2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම්

වසර තුළ රැස්කරන ලද සමස්ත ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හැර) ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් සමස්ත වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබාදුනි. තව ද, නිල තක්සේරු ආකාරයෙන් ආදායම් රැස්කිරීම මුළු එකතුවෙන් 6% ක් පමණක් විය. වසර තුළ සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක කරන ලද විගණන කාර්යයන් තුළින් පෙර වසර සමඟ සසඳා බලන කළ තක්සේරු තුළින් රැස්කිරීම් හි සුළු වැඩිවීමක් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, ස්වයං තක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙවරෙහි මූලික කොටසක් ලෙස ස්වේච්ඡා අනුකූලතාවය දිරි ගැන්වීම පිණිස ප්‍රයත්නයන් දරන ලදි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර මෙහි සාර්ථකත්වය සඳහා අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සලසන ලදි. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 05 වැනි වගුවෙහි දක්වා ඇත.

| වගුව 05 - ස්වයං තක්සේරු සහ වෙනත් පදනම් මත රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2014 ( රු.'000 ) | | 2015 ( රු.'000 ) | | 2016 ( රු.'000 ) | |
| | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 181,977,746 | 9,982,305 | 256,434,940 | 11,539,082 | 220,471,725 | 17,926,886 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ. හැර) | 129,744,521 | 5,890,227 | 130,510,553 | 4,688,017 | 161,404,285 | 6,710,993 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ. හැර) | 39,800,767 | 1,791,628 | 41,419,548 | 1,445,941 | 53,290,159 | 2,313,174 |
| වෙනත් | 143,486,800 | 1,486,719 | 113,907,066 | 477,215 | 34,757,043 | 873,072 |
| **එකතුව** | **495,009,834** | **19,150,879** | **542,272,107** | **18,150,250** | **496,923,212** | **27,824,125** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හැර) | 96% | 4% | 97% | 3% | 94% | 6% |

## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය

2016 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 06 වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 04 වන සටහනින් නිරූපණය කෙරේ. 2016 වසරේ රජයේ ආදායම රුපියල් මිලියන 1,686,061 (මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2016) දක්වා වැඩි වී ඇත්තේ මුළු රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීම්වල දායකත්වය 38.05% ක් ලෙස වාර්තා කරමිනි.


දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඛණ්ඩව පහළ ගොස් ඇති අතර, එය 2016 වසරේ දී 5.42% ක් ලෙස සුළු ඉහළයාමක් පෙන්නුම්

කරයි. මෑත කාලීන බදු දිරි දීමනා, විරාම, නිදහස් කිරීම් සහ සහනදායී බදු අනුප්‍රමාණයන් හඳුන්වාදීම එම ප්‍රතිශතයන්හි අඩුවීමේ ප්‍රවණතාවය සඳහා හේතු විය හැකිය.

**වගුව 06 - ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය.**

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදන (රු. මිලියන) | දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2012 | 1,051,461 | 443,456 | 42.18% | 7,582,376 | 5.85% |
| 2013 | 1,137,447 | 492,539 | 43.30% | 8,674,230 | 5.68% |
| 2014 | 1,195,206 | 514,161 | 43.02% | 9,784,672 | 5.25% |
| 2015 | 1,454,878 | 560,422 | 38.52% | 11,183,220 | 5.01% |
| 2016 | 1,686,061 | 641,547 | 38.05% | 11,838,975 | 5.42% |

මූලාශ්‍රය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව) ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව)




## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්වතක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මකව පැවතිණි. බදු නීතීන් කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාවය ඉහළ නැංවීම පිණිස කලින් ගෙවීම් කරන බදු සම්බන්ධයෙන් වට්ටම් ලබාදීම, වරප්‍රසාද කාඩ්පත් ලබාදීම (රන් සහ රිදී කාඩ්පත්) වැනි තනි පුද්ගල බදු ගෙවන්නන් සඳහා ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

ඒ අනුව, 2015/2016 තක්සේරු වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා කිරීමේ ප්‍රතිශතය 48% ක් වූ අතර නියමිත දිනයෙන් එක් මාසයක් තුළ එය 59% දක්වා ඉහළ

ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකක් තුළ සංස්ථාපිත අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 68% ක් විය.

සංස්ථාපිත අංශය සම්බන්ධයෙන්, එය නියමිත දිනට 30% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මාසයක් තුළ එය 46% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ මෙම අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 48% ක් විය.

සියලු බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය ස්වතක්සේරු බදු ක්‍රමයක අපේක්ෂිත මට්ටම් නොවුන ද, බොහෝ දුරට අනුකූල වී ඇත. කෙසේ වෙතත්, වාර්තා අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනු ලබයි.

කෙසේ වෙතත්, සැලකිල්ලට බඳුන් කරන වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්දෙහි සැලකිය යුතු අඩුවීමක් දැකගත හැකිය. වර්ෂය තුළ දී, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද ක්ෂේත්‍ර සමීක්ෂණය යටතේ නව බදු ගෙවන්නන් 75,811 දෙනෙක් ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි විණි. වාර්තා ඉදිරිපත් කිරීමේ දී එම බදු ගෙවන්නන්ට මනා අවබෝධයක් නොමැති වීම මෙම අඩුවීමට හේතු වූවා විය හැකිය.

07 වන වගුවෙන් 2011/2012 සිට 2015/2016 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 08 වන වගුවෙන් පෙන්වයි.

**වගුව 07 - ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2011/2012 සිට 2015/2016 දක්වා**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය |
|---|---|---|---|
| 2011/2012 | සංස්ථාපිත | 56% | 60% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2012/2013 | සංස්ථාපිත | 56% | 70% |
| | සංස්ථාපිත නොවන | 41% | 54% |
| 2013/2014 | සංස්ථාපිත | 53% | 61% |
| | සංස්ථාපිත නොවන | 42% | 57% |
| 2014/2015 | සංස්ථාපිත | 52% | 58% |
| | සංස්ථාපිත නොවන | 47% | 62% |
| 2015/2016 | සංස්ථාපිත | 30% | 46% |
| | සංස්ථාපිත නොවන | 48% | 59% |

**වගුව 08 - අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය**

| | එකතු කළ අගය මත බදු | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීමේ බදු | |
|---|---|---|---|---|---|
| වසර 2014 | 49% | 71% | 84% | තක්සේරු වර්ෂ 2013/14 | 55% |
| වසර 2015 | 65% | 68% | 86% | තක්සේරු වර්ෂ 2014/15 | 63% |
| වසර 2016 | 71% | 79% | 31% | තක්සේරු වර්ෂ 2015/16 | 57% |

## 2.9 ආදායම් බදු රැස්කිරීම

සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල (තනි පුද්ගල) ආදායම් බද්ද, ලාභාංශ බදු සහ රඳවාගැනීමේ බදු වලින් ආදායම රැස්කිරීම 2015 වසරේ රුපියල් මිලියන 256,435 හා සසඳා බලන කළ 2016 වසරේ දී රුපියල් මිලියන 238,398 දක්වා 7.03% කින් පහත වැටුණි. එය වසර සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායමෙන් 37.16% ක් වන අතර, එය 2015 වසරේ දී 45.76% ක් විය. 2015 වසරේ අතුරු අයවැය යෝජනා මගින් එක් වරක් පමණක් අයකරන බද්දක් ලෙස හඳුන්වාදෙන ලද රු. මිලියන 49 ක සුපිරි වාසි බද්ද 2015 වසරේ ආදායම් බදු රැස්කිරීමට ඇතුළත් ය. එසේම, අපනයනකරුවන්, විදුලිබල උත්පාදනය සහ යටිතල පහසුකම් සංවර්ධනය දිරිගැන්වීම පිණිස මෑත කාලීනව හඳුන්වාදෙන ලද බදු දිරි දීමනා, බදු විරාම සහ සහනදායී අනුප්‍රමාණයන් ද ආදායම් බද්දෙන් ආදායම අඩුවීම කෙරෙහි බලපාන හේතූන් විය හැකිය.

### 2.9.1 ආදායම් බදු රැස්කිරීම - ආංශීය වශයෙන් පැහැදිලි කිරීම

මුළු ආදායම් බදු රැස්කිරීම සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 144,134 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 60% ක් විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 94,265 ක් හෙවත් 40% කි.


අංක 9 වන වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර අංක 05 වන සටහනෙන් එය නිරූපණය කෙරේ.

| වගුව 09 - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2015 සහ 2016 | | | | |
|---|---|---|---|---|
| | 2016 | | 2015 | |
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 144,133,758,898 | 60% | 155,870,960,759.00 | 61% |
| සංස්ථාපිත නොවන** | 94,264,851,743 | 40% | 100,563,979,780.00 | 52% |
| **එකතුව** | **238,398,610,641** | **100%** | **256,434,940,539.00** | **100%** |

* 2015 වසරේ රු. මිලියන 12,340 ක සහ 2016 වසරේ රු. මිලියන 15,902 ක ලාභාංශ බදු ඇතුළත්ය.

** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉටු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද රඳවුම් (WHT) බදු සහ උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවා නියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් බදු ඇතුළත් ය.

**සටහන 05**
**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2015 සහ 2016**



### 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස්කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය (සේවා නියුක්ත සහ වෙනත්) අංක 10 දරන වගුවෙන් පෙන්නුම් කෙරේ.

| වගුව 10 - ආදායම් බදු රැස්කිරීම - 2016 | | |
|---|---|---|
| **ප්‍රභවය** | **බදු රැස් කිරීම (රු. මිලියන)** | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ. ක්‍රමය | 27,717.03 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම් | 481.09 | **28,198.12** |
| **වෙනත්** | | |
| ස්වයං තක්සේරු සහ දණ්ඩන සමඟ තක්සේරු කිරීම් | 132,060.87 | |
| පොළී මත රඳවාගැනීමේ බදු, කුලී සහ නියමිත ගාස්තු | 55,906.76 | |
| ප්‍රභවයේ දී වෙනත් අඩු කිරීම් | 22,297.55 | |
| **දළ බදු රැස් කිරීම** | | **238,463.30** |
| අඩු කළා: ආපසු ගෙවීම් | | (64.69) |
| **ශුද්ධ රැස් කිරීම්** | | **238,398.61** |


රඳවාගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම, ව්‍යාපාර, වෘත්තීය, රැකියාව සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්වතක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස්කිරීම් එකතුව රුපියල් මිලියන 132,061/- ක් වේ.

## 2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම.

අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු (VAT) රැස්කිරීම, පෙර වසරේ රැස් කරන ලද රුපියල් මිලියන 214,236 ට වඩා 24.42% ක වැඩිවීමක් පිළිබිඹු කරයි. වසර සඳහා රුපියල් මිලියන 270,000 ක ඇස්තමේන්තුව හා සසඳා බලන විට වුවද, වසර සඳහා ආදායම රු. මිලියන 13,451 කින් වැඩි වී ඇත. ලියාපදිංචිය සඳහා යටත් සීමාව අඩු කිරීම, එ.අ.බ. අනුපාතය වැඩි කිරීම, ඇතැම් නිදහස් කිරීම් ඉවත් කිරීම සහ RAMIS යටතේ පරිපාලනයේ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම එ.අ.බ. ආදායම වැඩිවීමට මහෝපකාරී විය. දේශීය සැපයුම් සහ ආනයන මත රැස්කරන ලද එ.අ.බ. කලින් වසරට වඩා සීඝ්‍ර වැඩිවීමක් පෙන්වයි. වසර සඳහා රැස්කරන ලද මුළු දේශීය එ.අ.බ. රුපියල් මිලියන 168,115 ක් වූ අතර මෙම අගය රුපියල් මිලියන 130,510 ක් වූ 2015 වසරේ අගයට වඩා රු. මිලියන 37,604 ක වැඩිවීමකි. මේ අතර එය වසර තුළ ආනයන මත රැස්කරන ලද එ.අ.බ. රු. මිලියන 83,726 ක් වූ අතර, 2016 වසරේ දී එය රු. මිලියන 115,336 ක් විය.

එකතු කළ අගය මත ආංශික වශයෙන් දළ රැස්කිරීම, ආපසු ගෙවීම සහ ශුද්ධ රැස්කිරීම 11 වන වගුවෙන් පෙන්වන අතර, එය 06 වන සටහනෙන් නිරූපණය කෙරේ.

| වගුව 11- එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2015** | | **2016** | | | | |
| **අංශය** | **ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන)** | | **දළ රැස් කිරීම් (රු. මිලියන)** | | **ආපසු ගෙවීම්** | **ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන)** | |
| **නිෂ්පාදන අංශය** | | 28,894.52 | | 35,853.69 | 440.78 | | 35,412.91 |
| **නිෂ්පාදන නොවන අංශය** | | | | | | | |
| - සේවාව | 73,719.51 | | 96,670.13 | | 64.51 | 96,605.62 | |
| - මූල්‍ය සේවාව | 27,896.35 | | 36,096.75 | | | 36,096.75 | |
| - වෛකල්පිත එ.අ.බ. | 0.17 | 101,616.03 | | 132,766.88 | | | 132,702.37 |
| ආනයන | | 83,726.43 | | 115,336.71 | 0.48 | | 115,336.23 |
| එකතුව | | **214,236.98** | | **283,957.28** | **505.77** | | **283,451.51** |




| වගුව - 12 දළ ජාතික නිෂ්පාදනයට එ.අ.බ. දායකත්වය ආංශීය වශයෙන් විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංශය | 2015 | | 2016 | | දළ ජාතික නිෂ්පාදනයට ප්‍රතිශතය | |
| | ශුද්ධ රැස්කිරීම් රු. | % | ශුද්ධ රැස්කිරීම් රු. | % | 2015 | 2016 |
| නිෂ්පාදන අංශය | 28,894,521,159 | 13.49% | 35,412,908,090 | 12.49% | 0.26% | 0.29% |
| නිෂ්පාදන නොවන අංශය | 101,616,031,540 | 47.43% | 132,702,369,902 | 46.82% | 0.91% | 1.12% |
| ආනයන මත | 83,726,432,785 | 39.08% | 115,336,235,788 | 40.69% | 0.75% | 0.97% |
| එකතුව | **214,236,985,484** | **100.00%** | **283,451,513,780** | **100.00%** | **1.92%** | **2.39%** |

2.10.1 **එකතු කළ අගය මත බදු කර්මාන්තය වශයෙන් දායකත්වය**

| වගුව - 13 දළ දේශීය එ.අ.බ - නිෂ්පාදන සහ සේවා අංශ | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2014 (රු.මි.) | 2015 (රු.මි.) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) | 2016 (රු.මි.) | පෙර වසර හා සසඳා බලන විට අඩු හෝ වැඩිවීමේ ප්‍රතිශතය |
| බැංකු කටයුතු | 18,822 | 23,089 | 22.67% | 27,770 | 20.27% |
| රක්ෂණ | 4,910 | 5,403 | 10.04% | 6,371 | 17.92% |
| හෝටල් සහ ආපනශාලා | 6,507 | 7,429 | 14.17% | 10,566 | 42.23% |
| ඉදි කිරීම | 6,943 | 6,605 | -4.87 | 8,230 | 24.60% |
| විදුලිබලය සහ ගෑස් | 560 | 501 | -10.54 | 526 | 4.99% |
| ආනයනය | 10,389 | 9,880 | -4.90 | 9,383 | -5.03 |
| මූල්‍ය | 13,982 | 18,487 | 32.22% | 20,242 | 9.49% |
| සංනිවේදනය | 394 | 376 | -4.57 | 7,429 | 1875.80% |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 1,509 | 417 | -72.37 | 175 | -58.03 |
| බීම - මද්‍යසාර | 9,930 | 396 | -96.01 | 1,553 | 292.17% |
| වර්ගීකරණය නොකළ සේවා | 9,866 | 12,295 | 24.62% | 39,690 | 222.81% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 10,280 | 9,173 | -10.77 | 29,079 | 217.01% |
| අනෙකුත් | 42,408 | 36,460 | -14.03 | 36,091 | -1.01 |
| එකතුව | **136,500** | **130,511** | **-4.39%** | **197,105** | **51.03%** |

2.10.2 **එකතු කළ අගය මත බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්**

අයවැය මගින් යෝජිත පරිදි එ.අ.බ. පනතට පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදි.

i **එ.අ.බ. අනුපාතය සංශෝධනය කිරීම.**

මූල්‍ය සේවා සැපයුම අතුළුව භාණ්ඩ හා සේවා සැපයුම මත එ.අ.බ. අනුපාතය පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

| කාලසීමාව | අනුප්‍රමාණය |
|---|---|
| 2016.05.02 සිට 2016.07.11 දක්වා | 15% |
| 2016.07.12 සිට 2016.10.31 දක්වා | 11% |
| 2016.11.01 සිට යම් කාලසීමාවක් සඳහා | 15% |

ii **එ.අ.බ. ලියාපදිංචි වීම සඳහා සීමාව**

(අ) 2016 අප්‍රේල් 1 දින හෝ එදිනට පසුව ආරම්භවන යම් කාලසීමාවක් සඳහා තොග වෙළෙඳාම හෝ සිල්ලර වෙළෙඳාම හැර මූල්‍ය සේවා ඇතුළුව යම් බදු අයකළ හැකි කටයුත්තක් කරගෙන යන තැනැත්තෙකු විසින් ලියාපදිංචිය සඳහා යටත් සීමාව මාස තුනක බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා රු. මිලියන 3 දක්වා හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රු. මිලියන 12 දක්වා අඩු කරන ලදි.

(ආ) ලිත් වර්ෂයක යම් කලින් පැවති මාස 3 ක කාලසීමාවක් සඳහා තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම සඳහා එ.අ.බ. ලියාපදිංචිය වෙනුවෙන් යටත් සීමාව 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි රු. මිලියන 100 සිට රු. මිලියන 12.5 දක්වා අඩු කරන ලදි.

iii තොග වෙළෙඳාම හෝ සිල්ලර වෙළෙඳාම කරගෙන යන යම් තැනැත්තෙකු විසින් නිදහස් භාණ්ඩ සැපයුම මත බදු බැඳියාව (Deemed VAT) එ.අ.බ. 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදි.

iv ලියාපදිංචි නොවූ තැනැත්තන් වෙතින් මිලදී ගන්නේ නම්, එ.අ.බ. සඳහා යටත් භාණ්ඩ සම්බන්ධයෙන්;

- 2016 මැයි 02 වන දින හෝ ඉන්පසුව එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට පෙර යම් දිනක එම ලියාපදිංචිය සිදුවන්නේ නම් එ.අ.බ. සඳහා ලියාපදිංචි දිනය වන විට නොවිකිණී පවත්නා එ.අ. බද්දට යටත් විකිණිය හැකි භාණ්ඩ (වේ නම්) තොගය මත,
- සැපයුම් සීමාව අඩු කිරීම හේතුකොට ගෙන තොග හෝ සිල්ලර වෙළෙඳාම් වර්ගීකරණය යටතේ 2016 මැයි 2 හෝ ඉන්පසු ලියාපදිංචි වූ තැනැත්තන්ට යෙදවුම් බදු සේ සැලකෙන එ.අ.බ. හඳුන්වා දෙන ලදි.

v. අපනයන අභිමුඛ ඇඟළුම් සමාගම් විසින් පහත ලැයිස්තු කර ඇති ඇඟළුම් හෝ රෙදි මත රැස්කරන ලද සංයුක්ත බද්ද (රේගුවේ දී අය කරනු ලබන එ.අ.බ. ජ.ගො.බ. සහ වෙනත් බදුවලට හිලව් වශයෙන්) රු.75/- දක්වා වැඩි කරන ලදි.

(අ) ආයෝජන මණ්ඩලය (BOI) හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල් (DCG) විසින් අවසර දෙනු ලබන පරිදි අපනයන අභිමුඛ ඇඟළුම් සමාගම් විසින් දේශීය වශයෙන් සපයන ලද රෙදිපිළි.

(ආ) ආයෝජන මණ්ඩලය (BOI) හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල් (DCG) විසින් අවසර ලබා දෙනු ලබන පරිදි එම සමාගම් විසින් දේශීය වශයෙන් සපයනු ලබන රෙදි හෝ පහත සඳහන් රෙදි නිෂ්පාදන.

- ලිනන් හෝ තිර රෙදි / කිලෝග්‍රෑමයකට
- ටවල්/එක් අයිතමයකට
- රෙදිවලින් නිපදවන ලද බෑග් / එක් අයිතමයකට
  දිගින් මීටර දෙකට වැඩි නොවන කැපූ කෑලි ලෙස අතිරේක රෙදි/ කිලෝග්‍රෑමයකට; හෝ
- වෙනත් යම් රෙදි / කිලෝග්‍රෑමයකට

vi යම් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ කල්බදු පහසුකම් සැපයීම මූල්‍ය සේවා මත එ.අ.බ. වලින් ඉවත් කරනු ලබන අතර සාමාන්‍ය එ.අ.බ. යටතේ බද්දට යටත් කරනු ලැබේ.

vii පහත සඳහන් නිදහස් කිරීම් 2016 මැයි 2 දින සිට 2016 ජූලි 11 දින දක්වා කාලසීමාව සඳහා සහ 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි යම් කාලසීමාවක් සඳහා එ.අ. බද්දට යටත් කරනු ලැබේ.

- විදුලි සංදේශ සේවා සැපයුම
- විදුලි සංදේශ කර්මාන්තය සඳහා තඹ කම්බි ඇතුලුව විදුලි සංදේශ උපකරණ හෝ යන්ත්‍ර සූත්‍ර, උසස් තාක්ෂණික උපකරණ ආනයනය හෝ සැපයීම.
- විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC) මගින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් සඳහා බලපත් නිකුත් කිරීම.
- වෛද්‍ය ආයතන හෝ වෘත්තීය සුදුසුකම් ලත් තැනැත්තන් විසින් සලසනු ලබන සෞඛ්‍යාරක්ෂණ සේවා සැපයීම (රෝග විනිශ්චය කිරීමේ පරීක්ෂණ, රුධිර කාන්දුකරණ ප්‍රතිකාර, බාහිර රෝගී අංශය මගින් සලසන සේවා හැර)
- නිවාස ව්‍යාපෘතීන් හැර 2016.05.02 දින හෝ ඉන්පසුව අනුමත කරන ලද යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම.

viii පහත සඳහන් නිදහස් කිරීම් ඉවත් කරන ලද අතර 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි එම සැපයුම් එ.අ. බද්දට යටත් කරන ලදි.

- කිරිපිටි ආනයනය හෝ සැපයීම.
- සීනි හෝ දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරි එකතු කරන ලද රසකාරක අන්තර්ගත දේශීය වශයෙන් නිෂ්පාදිත පිටිකිරි සැපයීම.
- යම් සමූපකාර සමිතියක් හෝ ලක් සතොස මගින් සලසන යම් භාණ්ඩ හෝ සේවා (සඳහන් භාණ්ඩ හෝ සේවා හැර) සැපයීම.
- සිගරට් ආනයනය හෝ සැපයීම.
- මත්පැන් ආනයනය හෝ සැපයීම.
- සැහැල්ලු බරැති විදුලි හා විද්‍යුත් උපකරණ ආනයනය හෝ සැපයීම.
- සුවඳ විලවුන් ආනයනය හෝ සැපයීම.
- දේශීය වශයෙන් නිෂ්පාදිත ස්වර්ණාභරණ සැපයීම.
- ගල් අඟුරු ආනයනය හෝ සැපයීම.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ම අමතර කොටස් සහ උපාංග ආනයනය හෝ සැපයීම.
- නේවාසික පහසුකම් බද්ද හෝ කුළිය (දිගු කාලීන කල්බදු ඇතුළත් ය.)


## 2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම්

අදාළ වර්ෂය තුළ මුළු ආදායමට ජා.ගො. බදු දායකත්වය රු. මිලියන 84,066 ක් විය. මෙය කලින් වර්ෂයේ රැස්කරන ලද ප්‍රමාණයට වඩා 23.79% ක් හෙවත් රු. මිලියන 16,155 ක වැඩිවීමකි. මුළු ජා.ගො.බදු ආදායමෙන් රු. මිලියන 26,642 ක් පළාත් සභා වෙත මාරු කරන ලදි.

| වගුව **14** - **ආංශික වශයෙන් ජා.ගො.බදු රැස්කිරීම - 2016** | | |
|---|---|---|
| **අංශය** | **ශුද්ධ රැස් කිරීම් (රු.)** | |
| | 2015 | 2016 |
| නිෂ්පාදන | 10,163,343,792 | 13,526,495,655 |
| සේවා | 31,256,204,685 | 42,076,837,588 |
| ආනයන | 26,491,513,723 | 28,463,193,481 |
| **එකතුව** | **67,911,064,215** | **84,066,526,724** |

15 වන වගුව මගින් පළාත් සභා වෙත මාරු කිරීමෙන් පසුව, පිළිවෙලින් 2015 වසරේ සහ 2016 වසරේ ජාතිය ගොඩනැගීමේ ආදායම් ඇස්තමේන්තුව රැස්කරන ලද ආදායම සමඟ සැසඳීම දක්වා ඇත.

| වගුව 15 - ඇස්තමේන්තු සමඟ ජාතිය ගොඩනැගීමේ බදු රැස් කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2016 | 54,000,000,000 | 57,424,138,359 | 106% |
| 2015 | 48,000,000,000 | 43,938,771,964 | 92% |




### 2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

අයවැය මගින් යෝජිත පරිදි ජාතිය ගොඩනැගීමේ බදු පනතට පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදි.

**(i) නිදහස් සීමාව**

කාර්තුවකට රු. මිලියන 3.75 හෝ ඇතැම් අංශ සඳහා රු. මිලියන 25 ජා.ගො. බද්දේ දැනට පවත්නා නිදහස් පිරිවැටුමේ සීමාව (විකිණීම සඳහා දේශීය වශයෙන් සපයනු ලබන කෘෂි නිෂ්පාදන පිරිවැටුම හැර) 2016 අප්‍රේල් 1 දින හෝ ඉන්පසුව ආරම්භවන කාර්තුවේ සිට රු.මිලියන 3 දක්වා අඩු කරන ලදි.

(ii) පහත සඳහන් නිදහස් කිරීම් ඉවත් කරන ලද අතර 2016.05.02 දින සිට 2016.07.11 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා සහ 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජා.ගො. බද්දට යටත් කරන ලදි.


- විදුලි සංදේශ සේවා
- විදුලිය බලය සැපයුම (ජාතික විදුලිබල පද්ධතියට සැපයීම ඇතුළුව).
- ලිහිසි තෙල් (පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් හැර පෙට්‍රෝලියම හෝ පැට්‍රෝලියම් නිෂ්පාදන)
- විශේෂ ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම. (2016 මැයි 02 දිනට පෙර සහ 2016 ජූලි 11 දින සිට 2016.10.31 දින දක්වා කාලසීමාව වෙනුවෙන් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද යම් නිවාස ව්‍යාපෘතීන් නොවන)

(iii) සිගරට් ආනයනය හෝ නිෂ්පාදන ව්‍යාපාරයක පිරිවැටුම මත අදාළ දැනට පවත්නා නිදහස් කිරීම ඉවත් කරනු ලබන අතර 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජා.ගො. බද්දට යටත් කරනු ලැබේ.

## 2.12 ආර්ථික සේවා ගාස්තු (ESC) රැස්කිරීම

අදාළ වර්ෂය තුළ සමස්ත ආ.සේ.ගා. රු. මිලියන 20,458 ක් වූ අතර එමගින් සමස්ත ආදායමට වූ දායකත්වය සියයට 3.19 කි. එය වසර සඳහා ඇස්තමේන්තුවෙන් සියයට 97කි.

| වගුව 16 ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2016 | 21,000,000,000 | 20,458,175,363 | 97% |
| 2015 | 6,500,000,000 | 6,148,447,689 | 95% |




### 2.12.1. ආර්ථික සේවා ගාස්තු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

ආර්ථික සේවා ගාස්තු සඳහා කරන ලද වෙනස්කම් අයවැය මගින් යෝජනා කරන ලදි.

(i) ලාභ උපයන ව්‍යාපාර ආර්ථික සේවා ගාස්තුවට යටත් කිරීම බැහැර කිරීම ඉවත් කරන ලදි.

(ii) වර්ෂයකට රු. මිලියන 120 ක වූ උපරිමය බදු බැඳියාව ඉවත් කරන ලදි.

(iii) අනුප්‍රමාණය 0.25% සිට 0.50% දක්වා වැඩි කරන ලදි.

(iv) 2016 අප්‍රේල් 1 දිනෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බදුවලට සාපේක්ෂව හිලව් කළහැකි ආර්ථික සේවා ගාස්තු ඉදිරියට ගෙනයාම සඳහා කාලසීමාව වසර 5 සිට වසර 3 දක්වා අඩු කරන ලදි. (ගෙවීම් කිරීමට නියමිත තක්සේරු වර්ෂය ඇතුළුව)

## 2.13 උපයන විට ගෙවීමේ බදු (PAYE) රැස්කිරීම

සේවා නියුක්ත ආදායම මත ආදායම් බද්දේ කොටස වන උ.වි.ගෙ. (PAYE) ක්‍රමය යටතේ වසර තුළ රැස්කරන ලද දළ ආදායම 2015 වසරේ වූ රු.මිලියන 26,205 ට සාපේක්ෂව රු.මිලියන 28,169 ක් විය.

## 2.14 රඳවා ගැනීමේ බදු (WHT) (පොළිය සහ නිශ්චිත ගාස්තු මත)


පොළිය මත රඳවා ගැනීමේ බදු රැස්කිරීම වසර තුළ රුපියල් 47,839,315,743/- ක් වූ අතර, එය රජයේ සුරැකුම්පත් වලින් රු.44,538,401,573/- ක් (2015 වසරේ දී රු.53,397,715,864) සහ ඉතිරිය අනෙකුත් සාධන පත්‍රයන්ගෙන් ලැබුණි. පොළිය මත රඳවාගැනීමේ බදු මගින් උපයාගන්නා ලද ආදායම පෙර වසරට වඩා රුපියල් මිලියන 14,572 කින් සීඝ්‍ර අඩු වීමක් පෙන්වයි.

## 2.15 ඔට්ටු සහ සුදු බදු රැස්කිරීම

වසර තුළ ඔට්ටු සහ සුදු බදු රැස්කිරීම රු.මිලියන 1,884 ක් වූ අතර, එය කලින් වසර හා සසඳා බලන කළ රු. මිලියන 1,502 ක ඉහළයාමක් පිළිඹිබු කරයි. එසේම අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා රු. මිලියන 984 ක අතිරික්තයක් විය.

වගුව 17 - ඔට්ටු හා සුදු බදු රැස් කිරීම්

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම රැස් කිරිම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2016 | 900,000,000 | 1,884,498,652 | 209% |
| 2015 | 2,200,000,000 | 831,922,843 | 38% |




## 2.16 රථවාහන හිමිකම් බද්ද

2015 අංක 10 දරන මුදල් පනත යටතේ පනවන ලද බලපත්‍රවල නිදහස් මෝටර් රථවාහන ආනයනය කිරීම වෙනුවට රථවාහන හිමිකම් ගාස්තුව 2016 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලදී.

මොටර් රථවාහනයක් ආනයනය කරනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම ණයවර ලිපියක් විවෘත කරන අවස්ථාවේ දී මෙම ගාස්තුව පහත සඳහන් අනුප්‍රමාණයන් යටතේ ගෙවිය යුතුය.

i. යතුරුපැදි සහ ත්‍රිරෝද රථ එක් වාහනයකට - රු. 2,000/- බැගින්
ii. මෝටර් කාර් එක් වාහනයකට - රු.15,000/- බැගින්

iii. අනෙකුත් සියලු රථවාහන එක් වාහනයකට - රු.10,000/- බැගින්

අදාළ වර්ෂය තුළ දී, රථවාහන හිමිකම් ගාස්තු වලින් ආදායම රැස්කිරීම රු. මිලියනන 1,574 ක් වූ අතර එය වසර සඳහා කරන ලද ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 829 ක අතිරික්තයක් විය.

## 2.17 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රු. මිලියන 10,651 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර බදු මාරුකිරීම) පනත ප්‍රකාර, මුද්දර බදු රැස්කිරීම් සම්පූර්ණ ප්‍රමාණය අදාළ පලාත් සභාවලට මාරු කරන ලදි. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂණ හමු පවත්වන ලද අතර, ඒ අනුව 2016 වසර තුළ ස්ථාන 205 ක් නිරීක්ෂණයට බඳුන් විය. සමථායන නියෝජිතයින් 9,286 ක් (2016.09.30 දිනට) මුද්දර බදු සඳහා විධිමත්ව ලියාපදිංචි වී තිබූ අතර, ඒ අතුරින් 9,278 දෙනෙකු උපලේඛන ඉදිරිපත් කොට තිබුනේ 100% අනුකූලතාවයක් වාර්තා කරමිනි.

## 2.18 ඉඩම් මත පැවරුම් බදු

ඉඩම් මත පැවරුම් බදු වලින් වර්ෂය සඳහා රැස්කිරීම රු. මිලියන 22 ක් විය. 2016 වසර සඳහා අයවැය යෝජනා මගින් මෙම බද්ද ඉවත් කිරීමට යෝජනා කරන ලදි.


## 2.19 දේශීය ආදායම් රැස්කිරීම - 2012 සිට 2016 දක්වා (බදු වශයෙන්)

වගුව **18 - දේශීය ආදායම් රැස්කිරීම 2012 සිට 2016 දක්වා බදු වශයෙන් විශලේෂණය**

| බදු වර්ග | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව රු.මි. | % | එකතුව රු.මි. | % | එකතුව රු.මි. | % | එකතුව රු.මි. | % | එකතුව රු.මි. | % |
| ආදායම් බද්ද | 157,729 | 35.57 | 199,070 | 40.42 | 191,960 | 37.33 | 256,435 | 47.56 | 238,399 | 37.10 |
| ආර්ථික සේවා ගාස්තු | 14,864 | 3.35 | 6,596 | 1.34 | 6,155 | 1.2 | 6,148 | 1.1 | 20,458 | 3.19 |
| එකතු කළ අගය මත බද්ද | 204,656 | 46.15 | 217,687 | 44.2 | 237,915 | 46.27 | 214,237 | 38.23 | 283,451 | 44.18 |
| ඔට්ටු හා සූදු බද්ද | 289 | 0.07 | 592 | 0.12 | 815 | 0.16 | 832 | 0.15 | 1,884 | 0.29 |
| කොටස් හුවමාරු බද්ද | 1,285 | 0.29 | 1,197 | 0.24 | 2,048 | 0.4 | 1,395 | 0.25 | 738 | 0.12 |
| පිරිවැටුම් බද්ද | 138 | 0.03 | 218 | 0.04 | 472 | 0.09 | 16 | - | 17 | - |
| මුද්දර බද්ද | 6,535 | 1.47 | 6,884 | 1.4 | 7,918 | 1.54 | 11,596 | 2.07 | 10,651 | 0.62 |
| භාන්ඩ හා සේවා බද්ද | 12 | - | 16 | - | 3 | - | 0.88 | - | 1.59 | - |
| ජාතික ආරක්ෂක බද්ද | 4 | - | 2 | - | 14 | - | 12 | - | 8 | - |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 710 | 0.16 | 751 | 0.15 | 842 | 0.16 | 753 | 0.13 | 259 | 0.04 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 57,106 | 12.88 | 59,397 | 12.06 | 65,354 | 12.71 | 67,911 | 12.12 | 84,066 | 13.11 |
| ඉඩම් බද්ද | - | - | 97 | 0.02 | 579 | 0.11 | 1,066 | 0.19 | 23 | - |
| රථවාහන හිමිකම් බද්ද | - | - | - | - | - | - | - | - | 1,579 | 0.25 |
| සංචාරක බද්ද | - | - | - | - | - | - | - | - | 11 | - |
| සමාජ වගකීම් බද්ද | 127 | 0.03 | 32 | 0.01 | 85 | 0.02 | 20 | - | 1 | - |
| **මුළු රැස්කිරීම** | **443,455** | **100** | **429,539** | **100** | **514,160** | **100** | **560,422** | **100** | **641,546** | **100** |

**සටහන 10**

**2012 සිට 2016 දක්වා දේශීය ආදායම් රැස්කිරීම් බදු අනුව විශ්ලේෂණය**



**Distribution of Staff and Revenue Amoung The Assessing Divisions as at 31-12-2016**

| Assessing Divisions | Staff | | | | | | Revenue (Rs. Mn) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | CIR | SDCIR/ DCIR | ACIR | STO/TO | Other | Total | INCOME TAX/SRL | PAYE | E.S.C | VAT/ GST/ O.VAT | NBT | TT / B&G / Other | STL | SD/LT | TOTAL |
| Unit 01 & 02 | 2 | - | 20 | - | 14 | 36 | 886.68 | - | 0.09 | 5.36 | 2.08 | - | - | - | 894.21 |
| Unit 04 | 1 | - | 10 | - | 11 | 22 | 1,279.24 | 348.41 | 199.86 | 1,279.16 | 767.63 | 1.58 | - | - | 3,875.87 |
| Unit 05 | 1 | - | 10 | - | 13 | 24 | 1,815.63 | 578.73 | 255.15 | 1,491.18 | 606.61 | 0.15 | - | - | 4,747.45 |
| Unit 10 | 2 | 1 | 17 | - | 16 | 36 | 10,933.22 | 2,930.29 | 2,591.56 | 15,583.62 | 5,093.87 | 0.44 | - | - | 37,133.00 |
| Unit 13 | 1 | - | 20 | - | 11 | 32 | 537.82 | 126.41 | 124.07 | 1,096.78 | 812.44 | 3.65 | - | - | 2,701.18 |
| Unit 14 | 1 | - | 15 | - | 16 | 32 | 508.16 | 102.07 | 67.15 | 685.10 | 446.91 | 0.03 | - | - | 1,809.42 |
| Unit 15 | 1 | 1 | 13 | - | 15 | 30 | 484.68 | 70.44 | 74.42 | 610.26 | 410.92 | 0.53 | - | - | 1,651.26 |
| Unit 16 | 1 | - | 17 | - | 10 | 28 | 704.01 | 119.51 | 183.71 | 1,592.96 | 762.49 | - | - | - | 3,362.68 |
| Unit 17 | 1 | 1 | 15 | - | 12 | 29 | 1,453.17 | 623.47 | 264.50 | 4,067.10 | 1,408.86 | - | - | - | 7,817.11 |
| Unit 18 | 1 | - | 18 | - | 6 | 25 | 1,891.39 | 680.44 | 247.09 | 2,245.77 | 1,175.11 | - | - | - | 6,239.80 |
| Unit 4 A | 1 | - | 13 | - | 11 | 25 | 684.61 | 168.08 | 83.56 | 582.02 | 365.83 | 1.24 | - | - | 1,885.34 |
| Unit 4 B | 1 | - | 14 | - | 10 | 25 | 571.86 | 132.13 | 92.77 | 1,122.60 | 341.18 | 0.09 | - | - | 2,260.63 |
| Unit 5 A | 1 | - | 15 | - | 10 | 26 | 1,649.98 | 487.30 | 328.79 | 1,589.86 | 683.27 | 1.77 | - | - | 4,740.98 |
| Unit 5 B | 2 | 1 | 15 | - | 18 | 36 | 8,935.57 | 602.26 | 201.56 | 493.93 | 75.77 | 0.00 | - | - | 10,309.10 |
| Unit 5 C | 1 | - | 13 | - | 11 | 25 | 814.28 | 157.39 | 91.27 | 682.11 | 357.68 | 0.34 | - | - | 2,103.09 |
| Unit 5 D | 1 | 1 | 15 | - | 11 | 28 | 695.91 | 265.27 | 103.44 | 1,137.82 | 463.41 | 0.13 | - | - | 2,665.98 |
| Unit 5 E | 1 | - | 14 | - | 12 | 27 | 1,219.98 | 306.20 | 193.65 | 635.72 | 427.51 | - | - | - | 2,783.07 |
| Unit 5 F | 1 | - | 13 | - | 9 | 23 | 485.97 | 175.13 | 111.72 | 615.96 | 291.63 | 0.01 | - | - | 1,680.42 |
| Unit 6 A | 2 | 1 | 12 | - | 16 | 31 | 14,171.85 | 1,832.92 | 2,855.13 | 9,860.20 | 4,848.82 | 0.19 | - | - | 33,569.10 |
| Unit 6 B | 2 | - | 14 | 1 | 12 | 29 | 11,673.54 | 3,614.04 | 1,914.00 | 9,941.22 | 3,902.03 | 0.60 | - | - | 31,045.43 |
| Unit 6 C | 2 | 2 | 16 | - | 17 | 37 | 39,552.89 | 4,869.53 | 3,166.91 | 50,171.46 | 8,265.05 | 0.07 | - | - | 106,025.90 |
| Unit 7 A | 2 | 2 | 11 | 1 | 18 | 34 | 7,100.41 | 2,164.25 | 1,583.84 | 15,707.21 | 4,466.48 | 0.03 | - | - | 31,022.21 |
| Unit 7 B | 2 | 1 | 12 | 1 | 15 | 31 | 7,105.10 | 1,062.52 | 943.78 | 6,298.70 | 1,719.74 | - | - | - | 17,129.84 |
| Unit 8 A | 2 | - | 16 | - | 17 | 35 | 16,191.49 | 3,140.13 | 2,154.53 | 15,253.98 | 2,974.52 | 0.08 | - | - | 39,714.73 |
| Unit 8 B | 1 | 2 | 1 | 1 | 13 | 18 | 5,711.62 | 1,546.84 | 1,008.13 | 10,082.26 | 2,323.80 | 3.40 | - | - | 20,676.07 |
| WHT | 1 | - | 10 | - | 4 | 15 | 56,972.15 | - | - | - | - | - | - | - | 56,972.15 |
| PAYE | 1 | - | 9 | - | 12 | 22 | 2,566.98 | 153.40 | - | - | - | - | 550.06 | - | 3,270.44 |
| Betting & Gaming | 1 | - | 4 | - | 2 | 7 | - | - | - | - | - | 1,884.50 | - | - | 1,884.50 |
| Stamp Duty | 1 | 2 | 16 | - | 13 | 32 | - | - | - | - | - | - | - | 8,505.42 | 8,505.42 |
| VAT | 2 | - | 17 | - | 10 | 29 | - | - | - | 2,645.61 | - | - | - | - | 2,645.61 |
| Colombo Central | 1 | 2 | 18 | - | 16 | 37 | 895.14 | - | 37.13 | 333.13 | 590.80 | - | - | - | 1,856.20 |
| Colombo City | 1 | 1 | 20 | - | 20 | 42 | 777.43 | - | 45.21 | 267.87 | 657.00 | - | - | - | 1,747.51 |
| Colombo South | 1 | 1 | 16 | - | 17 | 35 | 1,078.96 | - | 27.59 | 388.74 | 197.70 | - | - | - | 1,692.98 |
| Maharagama East | 1 | - | 25 | - | 17 | 43 | 440.47 | - | 12.08 | 349.40 | 369.73 | - | - | - | 1,171.69 |
| Maharagama West | 1 | - | 22 | - | 13 | 36 | 594.01 | - | 9.41 | 240.43 | 298.36 | - | - | - | 1,142.21 |
| Anuradhapura | 1 | - | 21 | - | 20 | 42 | 366.95 | - | 8.77 | 113.00 | 290.61 | - | - | - | 779.33 |
| Badulla | 1 | 1 | 14 | - | 19 | 35 | 330.51 | - | 13.37 | 77.53 | 252.17 | - | - | - | 673.58 |
| Batticaloa | 1 | - | 11 | - | 15 | 27 | 171.15 | - | 1.43 | 50.46 | 176.77 | - | - | - | 399.81 |
| Dambulla | 1 | 1 | 25 | - | 15 | 42 | 175.70 | - | 8.30 | 56.35 | 200.79 | - | - | - | 441.14 |
| Galle | 1 | - | 27 | - | 20 | 48 | 233.08 | - | 16.01 | 99.19 | 227.19 | - | - | - | 575.47 |
| Gampaha | 1 | 1 | 23 | - | 16 | 41 | 553.32 | - | 26.03 | 366.30 | 589.10 | - | - | - | 1,534.75 |
| Jaffna | 1 | - | 3 | - | 16 | 20 | 110.80 | - | 0.07 | 89.73 | 176.95 | - | - | - | 377.55 |
| Kaluthara | 1 | - | 21 | - | 23 | 45 | 223.11 | - | 21.15 | 134.95 | 223.97 | - | - | - | 603.17 |
| Kandy | 1 | 1 | 38 | - | 22 | 62 | 572.10 | - | 16.64 | 212.88 | 355.24 | - | - | - | 1,156.86 |
| Kegalle | 1 | 1 | 14 | - | 21 | 37 | 180.45 | - | 4.64 | 83.93 | 127.94 | - | - | - | 396.97 |
| Kurunagala | 1 | 1 | 33 | - | 20 | 55 | 364.98 | - | 21.56 | 131.73 | 319.38 | - | - | - | 837.67 |
| Matara | 1 | 1 | 21 | - | 19 | 42 | 298.68 | - | 28.55 | 62.68 | 289.05 | - | - | - | 678.97 |
| Negombo | 1 | 1 | 21 | - | 15 | 38 | 452.28 | - | 27.55 | 168.74 | 345.51 | - | - | - | 994.09 |
| Nuwaraeliya | 1 | 1 | 13 | - | 14 | 29 | 200.57 | - | 9.39 | 44.40 | 183.76 | - | - | - | 438.11 |
| Ratnapura | 1 | 1 | 17 | - | 15 | 34 | 412.19 | - | 34.75 | 53.07 | 281.32 | - | - | - | 781.33 |
| **Sub Total** | **60** | **29** | **808** | **4** | **718** | **1,619** | **205,030.09** | **26,257.18** | **19,210.34** | **158,802.49** | **49,146.98** | **1,898.82** | **550.06** | **8,505.42** | **469,401.37** |

| | |
|---|---|
| **VAT(Import)** | **115,338.99** |
| **NBT(Import)** | **28,463.19** |
| **Treasury Transfer** | **7,268.99** |
| **Refunds** | **(570.47)** |
| **Adjustments,Unclasified Revenue,Dishonored Cheques and Others** | **21,644.68** |
| **Net Collection (Including Stamp Duty & NBT 1/3 Transferred to Provincial Councils)** | **641,546.76** |

# පරිච්ඡේදය 3

# වියදම් සහ ඵලදායිතා අනුපාතය

වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,061 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 4,437 සමඟ සසඳා බැලීමේ දී එය 8.47% ක පහළයාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 69.96% ක් හෙවත් රු.මිලියන 2,841 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2015 වසරේ දී, අනුරූපී අගය රු.මිලියන 2,428 ක් විය. වේතන සඳහා වූ වියදම 2015 වසරේ පැවති රු.මිලියන 1,783 ට සාපේක්ෂව 11.287% කින් ඉහළ යාමකි. මුළු වියදමෙන් 48.87% ක් සහ පුනරාවර්තන වියදමෙන් 69.84% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.

2015 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 39.27% කින් අඩුවීමක් වාර්තා කරන ලද අතර එය රු.මිලියන 1,220 ක් විය. මෙම අගය 2015 වසරේ දී රු.මිලියන 2,009 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 30.04% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි.


අදාළ වර්ෂය තුළ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සඳහා කරන ලද ආයෝජනය රු.මිලියන 1,108 ක් විය.

## 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2014, 2015 සහ 2016 වර්ෂ සමඟ සැසඳීම


**වගුව 19 - මුළු වියදම් 2014, 2015 සහ 2016 වර්ෂ සමඟ සැසඳීම**

| විස්තරය | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | ( රු.'000 ) | % | ( රු.'000 ) | % | ( රු.'000 ) | % |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පඩිනඩි | 1,413,734 | 45.78% | 1,783,351 | 40.19% | 1,984,484 | 48.87% |
| ගමන් වියදම් | 17,722 | 0.57% | 22,337 | 0.50% | 33,172 | 0.82% |
| සැපයුම් | 103,684 | 3.36% | 86,449 | 1.95% | 107,990 | 2.66% |
| නඩත්තු | 63,671 | 2.06% | 47,768 | 1.08% | 52,562 | 1.29% |
| කොන්ත්‍රාත් සේවා | 372,162 | 12.05% | 453,239 | 10.21% | 624,199 | 15.37% |
| පැවරුම් | 31,438 | 1.02% | 35,268 | 0.79% | 38,752 | 0.95% |
| **උප එකතුව** | **2,002,411** | **64.85%** | **2,428,412** | **54.73%** | **2,841,159** | **69.96%** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම | 101,614 | 3.29% | 73,624 | 1.66% | 29,425 | 0.72% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 49,343 | 1.60% | 31,820 | 0.72% | 27,130 | 0.67% |
| ධාරිතා ගොඩනැගීම | 127,793 | 4.14% | 385,170 | 8.68% | 55,031 | 1.36% |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 806,802 | 26.13% | 1,518,108 | 34.21% | 1,108,385 | 27.29% |
| **උප එකතුව** | **1,085,552** | **35.15%** | **2,008,722** | **45.27%** | **1,219,971** | **30.04%** |
| **මුළු එකතුව** | **3,087,963** | **100.00%** | **4,437,134** | **100.00%** | **4,061,130** | **100.00%** |

**සටහන 11**
**මුළු වියදම් – 2014, 2015 සහ 2016**




**සටහන 12**
**පුනරාවර්තන වියදම් 2016**



### 3.2 ඵලදායිතා අනුපාතය

2016 වසරේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,061.13 ක් වූ අතර, රැස්කළ ආදායම රුපියල් මිලියන 641,546.75/- ක් විය. එබැවින් ඵලදායිතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස්කළ ආදායම) 158:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රැස්කිරීමේ පිරිවැය, රුපියල් 100 ක් සඳහා ශත 63 ක් ලෙස ගණනය කෙරේ. රැස් කිරීමේ පිරිවැය; ආනයනයේ දී රැස්කරන ලද එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු හැර රුපියල් 100 ක් සඳහා ශත 84 ක් විය. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 79 සහ ශත 98 ක් විය.)

2014 - 2016 වසර දක්වා ආදායම් රැස්කිරීම, මුළු වියදම් සහ රැස්කිරීමේ පිරිවැය වර්ගීකරණයක් 22 වන වගුවෙහි දැක්වේ.

**වගුව 20 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය ( රු. මිලියන)**

| විස්තරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| **ආදායම් රැස් කිරීම** | | | |
| ආදායම් බද්ද | 191,960.05 | 256,434.94 | 238,398.61 |
| ආර්ථික සේවා ගාස්තු | 6,154.51 | 6,148.45 | 20,458.17 |
| එකතු කළ අගය මත බද්ද | 237,915.43 | 214,236.99 | 283,451.51 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 65,353.98 | 67,911.06 | 84,066.53 |
| හර බද්ද | - | - | 1,884.50 |
| ඔට්ටු හා සූදු බද්ද | 815.18 | 831.92 | 737.66 |
| කොටස් ගනුදෙනු බද්ද | 2,048.05 | 1,394.92 | 16.64 |
| පිරිවැටුම් බද්ද | 472.18 | 15.77 | 10,650.97 |
| මුද්දර බද්ද | 7,918.14 | 11,595.88 | 1.59 |
| භාණ්ඩ හා සේවා බද්ද | 3.46 | 0.89 | 8.09 |
| ජාතික ආරක්ෂක බද්ද | 13.77 | 11.63 | 258.80 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 841.83 | 753.31 | 22.66 |
| ඉඩම් බද්ද | 579.47 | 1,066.64 | 1,579.13 |
| සංචාරක බද්ද | | | 11.05 |
| සමාජ වගකීම් බද්ද | 84.66 | 19.96 | 0.84 |
| **මුළු එකතුව** | **514,160.71** | **560,422.36** | **0641,546.75** |
| **පුනරාවර්ථන වියදම්** | | | |
| පඩිනඩි | 1,413.73 | 1,783.35 | 1,984.48 |
| ගමන් වියදම් | 17.72 | 22.34 | 33.17 |
| සැපයුම් හා උපකරණ | 103.68 | 86.45 | 107.99 |
| නඩත්තු හා අලුත්වැඩියා | 63.67 | 47.77 | 52.56 |
| සේවා | 372.16 | 453.24 | 624.20 |
| මාරු කිරීම් | 31.44 | 35.27 | 38.75 |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | 101.61 | 73.62 | 29.42 |
| අත්පත්කර ගැනීම් | 49.34 | 31.82 | 27.13 |
| ධාරිතා ගොඩනැගිලි | 127.79 | 385.17 | 55.03 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 806.80 | 1,518.11 | 1,108.39 |
| **මුළු වියදම** | **3,087.94** | **4,437.14** | **4,061.12** |
| | | | |
| රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.6** | **0.79** | **0.63** |
| ආනයනමත එකතු කළ අගය මත බදු හා ජා.ගොඩ. බදු හැර රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.79** | **0.98** | **0.84** |

### 3.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන ලද විගණනවලට සියලු වියදම් එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන), පඩි ලැයිස්තු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව සහ මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද, මෙයට අතිරේක වශයෙන්, අගරු චෙක්පත්වල මුදල් අයකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, එ.අ.බ. සහ ආදායම් බදුවලින් ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

# පරිච්ඡේදය 4

# පැහැර හරින ලද බදු

## 4.1 පැහැර හරින ලද බදු

23 වන වගුවෙන් 2016.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණය, අත්හිටවූ බදු ප්‍රමාණය, දණ්ඩන සහ රැස් කරගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණය නිරූපණය කරයි.

**වගුව 21 - පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2016.12.31 දිනට**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදුවලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන(රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 101,493,513,132 | 58,681,797,527 | 94,413,477,489 | 56,147,950,143 | 7,080,035,643 | 2,533,847,384 |
| ආදායම් බද්ද මත අධිභාරය | 312,572,256 | 175,441,208 | 309,629,665 | 173,969,908 | 2,942,591 | 1,471,300 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැ. බදු) | 1,493,874,921 | 678,201,836 | 198,887,225 | 84,407,176 | 1,294,987,696 | 593,794,660 |
| එ.අ.බ. | 50,903,087,485 | 35,921,153,837 | 43,773,970,527 | 31,016,892,815 | 7,129,116,958 | 4,904,261,022 |
| එ.අ.බ. (මූල්‍ය සේවා) | 10,431,406,308 | 6,332,913,050 | 10,408,436,308 | 6,306,780,666 | 22,970,000 | 26,132,384 |
| ආ.සේ. ගා. | 4,185,081,101 | 3,488,509,674 | 3,395,606,018 | 2,958,916,810 | 789,475,083 | 529,592,864 |
| ජා.ගො.බ. | 6,559,705,994 | 5,040,324,449 | 4,086,894,000 | 3,684,756,890 | 2,472,811,994 | 1,355,567,559 |
| ජා.ගො.බ. (මූල්‍ය සේවා) | 26,225,412 | 10,393,611 | 19,400,119 | 7,877,118 | 6,825,293 | 2,516,493 |
| මුද්දර බද්ද | 9,732,724 | 4,866,362 | - | - | 9,732,724 | 4,866,362 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 2,186,816,913 | 1,071,847,251 | 2,186,816,913 | 1,071,847,251 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 935,744,986 | 1,012,921,300 | 935,744,986 | 1,012,921,300 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 1,306,636,091 | 563,160,681 | 1,306,636,091 | 563,160,681 | - | - |
| ජාතිය ගොඩනැගීමේ දායක මුදල | 14,961,095 | 4,667,439 | 14,961,095 | 4,667,439 | - | - |
| ධන බද්ද | 849,952 | 403,652 | 849,952 | 403,652 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 1,919,965 | 148,425 | 1,914,874 | 146,995 | 5,091 | 1,430 |
| සමථයකට පත්වන දණ්ඩන | - | 231,856,086 | - | 114,788,295 | - | 117,067,791 |
| **එකතුව** | | **113,218,607,592** | **163,268,809,039** | **103,149,488,343** | **18,808,903,073** | **10,069,119,249** |

සටහන:

i. අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන් ම සම්පූර්ණයෙන් ම හිඟව නොපවතී.

ii. කවර වූ හේතුවක් මත තක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශන ඉදිරිපත් කිරීම යනාදී) නොගෙවූ හෝ හිඟ මුදලක් උද්ගත වේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහා ම 2% ක ප්‍රමාණයක් සහ එ.අ.බ. සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම්කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විට ඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) අදාළ බදු පැහැර හරින ලද බදු ලෙස සලකනු ලැබේ. මෙම බදු ප්‍රමාණයන් මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිට වූ බදු ලෙස වර්ගීකරණය කළහැකි ය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළ යම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළයුතු වේ.

## 4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම්

(අ) හිඟ බදු අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ පියවරයන් අදාළ ප්‍රඥප්තීන් හි දැක්වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැක ගත හැකිය.

(ආ) 2010 අංක 16 දරන හිඟ බදු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අයකර ගැනීමේ අංශය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර, අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අයකර ගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟ බදු අයකර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම.

2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලත් වර්ෂයක අවසානය වන විට මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටස හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩිවන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් සියයට තුනක් නොඉක්මවන බවට වගබලාගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

ඒ අනුව,

| | | |
|---|---|---|
| 2016.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | - | රු. 18,808,903,073 |
| අඩු කළා | | |
| 2015.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | | රු.22,526,949,150 |
| 2016 වර්ෂයේ හිඟ බදු වැඩිවීම | | රු. 3,718,046,077 |
| | | |
| 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු බදු රැස්කිරීම් | - | රු. 524,834,223,679 |
| 2015 වර්ෂයේ මුළු බදු රැස්කිරීම් වලින් 3% | - | රු. 15,745,026,710 |

එබැවින් 2016 වසරේ දී හිඟ බදුවල ශුද්ධ එකතුවීමක් දක්නට නොමැත. ඒ අනුව 2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතින් අපේක්ෂිත ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස්කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

# පරිච්ඡේදය 5

# විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

### 5.1 විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුකූලව, සමස්ත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව 2016 වසර තුළ දී විගණන සහ විමර්ශන කටයුතු සිදුකරන ලදි. විමර්ශන සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම තුළින් සුවිශාල බදු ගෙවන්නන්ට අදාළව ලාභාංශ ගෙවා ඇති බව නිරීක්ෂණය වී ඇත. සමාලෝචනයට බඳුන් කරන වසර තුළ, අවසන් රාජකාරිය (back duty) සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමේ මහඟු ඵල ගෙන දෙමින් මෙම වර්ගය සම්බන්ධයෙන් තේරීමේ ක්‍රියාවලිය දැඩි අවධානයට යොමු කර ඇත.

| වගුව 22 - වර්ෂය තුළ සිදුකරන ලද විගණන සහ අතිරේක බදු රැස්කිරීම පිළිබඳ විස්තර (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් බද්ද | එ.අ.බ. | ආ.සේ.ගා. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | වෙනත් | එකතුව |
| වර්ෂය තුළ තක්සේරු කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 21,482,253 | 6,055,456 | 442,375 | 309,428 | 2,775,673 | 2,497,357 | 33,562,542 |
| වර්ෂය තුළ රැස්කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 14,528,500 | 4,952,126 | 425,370 | 296,383 | 2,214,325 | 1,204,139 | 23,620,843 |
| 2016 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද විගණන සංඛ්‍යාව | 7,941 | | | | | | |
| 2016 වර්ෂය තුළ දී අවසන් කරන ලද විගණන සංඛ්‍යාව | 7,790 | | | | | | |

| වගුව 23 - සංස්ථාපිත සහ අනෙකුත් අංශ වලින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන ඇතුළුව) | | | | | | |
|---|---|---|---|---|---|---|
| විස්තරය | තක්සේරු කරන ලද හා එකඟ වූ අතිරේක ආදායම/පිරිවැටුම (රු.) | තක්සේරු කරන ලද සහ එකඟ වූ අතිරේක බදු (රු.) | | | | |
| | | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | සංස්ථාපිත අනෙකුත් | අනෙකුත් ඒක | එකතුව | රැස් කරන ලද අතිරේක බදු (රු.) හිලව් කළ ආපසු ගෙවීම් ඉල්ලීම් ඇතුළුව) |
| ආදායම් බද්ද | 63,931,612 | 10,868,470 | 3,681,340 | 6,932,443 | 21,482,253 | 14,528,500 |
| එකතු කළ අගය මත බද්ද | 37,626,698 | 1,185,305 | 2,991,938 | 1,878,213 | 6,055,456 | 4,952,126 |
| ආර්ථික සේවා ගාස්තු | 67,849,949 | 61,359 | 373,640 | 7,376 | 442,375 | 425,370 |
| උපයන විට ගෙවීම් | 2,466,010 | 13,991 | 112,750 | 182,687 | 309,428 | 296,383 |
| ජ.ගො.බ. | 116,913,284 | 339,512 | 1,624,171 | 811,990 | 2,775,673 | 2,214,325 |
| අනෙකුත් | 12,174,232 | 2,397,540 | 84,659 | 15,158 | 2,497,357 | 1,204,139 |
| එකතුව | **300,961,785** | **14,866,177** | **8,868,498** | **9,827,867** | **33,562,542** | **23,620,843** |

### 5.2 අභියාචනා

තක්සේරුවලට එරෙහිව ලැබූ අභියාචනා 552 ක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී විසඳා අවසන් කරන ලද අතර අභියාචනා විශ්ලේෂණය කිරීමේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| වගුව 24 - ලැබූ සහ නිරාකරණය කරන ලද අභියාචනා සම්බන්ධ විශ්ලේෂණය | | ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2016.01.01 දිනට ශේෂය | අංශ APL 2 පරිදි | 91 | 0 | 0 | 70 | 2 | 163 |
| | අභියාචනා අංශය (APL 2 පරිදි) | 85 | 108 | 2 | 30 | 6 | 231 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 74 | 108 | 0 | 71 | 1 | 273 |
| වර්ෂය තුළ දී ලියාපදිංචිය (APL 2 පරිදි) | | **437** | **105** | **0** | **110** | **4** | **656** |
| අවසන් කළ | නිර්ණය කරන ලද (දේ.ආ.කො.ජ.) | 55 | 94 | 0 | 47 | 0 | 196 |
| | අංශ (APL 4 පරිදි) | 131 | 0 | 0 | 38 | 2 | 171 |
| | අභියාචනා අංශය | 79 | 80 | 2 | 15 | 9 | 185 |
| දේ.ආ.කො.ජ. ට විභාගය සඳහා ඉදිරිපත් කළා | | **63** | **67** | **0** | **57** | **1** | **188** |
| 2016.12.31 දිනට ශේෂය | ඒකක (APL 2 පරිදි) | 302 | 0 | 0 | 80 | 0 | 382 |
| | *අභියාචනා අංශය (APL 2 පරිදි) | 38 | 66 | 0 | 20 | 0 | 124 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 82 | 100 | 0 | 81 | 2 | 265 |
| *වර්ෂය තුළ දී අභියාචනා අංශයට ලැබුණ ලිපිගොනු | | **112** | **105** | **0** | **70** | **6** | **293** |

## 5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන

දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු විශේෂ විගණන ඒකකය මගින් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණනයන් ලෙස වර්ෂය තුළ දී සිද්ධීන් (ලිපිගොනු) 2076 ක් සම්පූර්ණ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරේක බදු ලෙස රු.764,496,267/- ක මුදලක් රැස්කරගත හැකි විය.

## 5.4 අය ක්‍රියා මාර්ග

වර්ෂය තුළ බදු අය කිරීම් සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, ලිපිගොනු සංඛ්‍යාව හා නිවේදන සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| වගුව 25 - අය ක්‍රියා මාර්ග | සිද්ධීන් | දැන්වීම් |
|---|---|---|
| තහනම් නියෝග නිකුත් කිරීම | 3,381 | 4,038 |
| නඩු පැවරීම් | 2,321 | 1,619 |
| වෙනත් ක්‍රියා මාර්ග | 5,828 | 6,425 |

## 5.4 ආපසු ගෙවීම්

වර්ෂය තුළ දී සිදු කරන ලද ආපසු ගෙවීම් පිළිබඳ විශ්ලේෂණය (හිඟ බදු සඳහා හිලව් කළ ආපසු ගෙවීම් හැර) පහත දැක්වේ.

| වගුව 26 - ආපසු ගෙවීම් විශ්ලේෂණ | | | | |
|---|---|---|---|---|
| බදු වර්ගය | 2015 | | 2016 | |
| | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % |
| එකතු කළ අගය මත බදු | 931,478,754 | 0.43% | 505,773,176 | 0.18% |
| සංස්ථාපිත ආදායම් බදු | 18,410,241 | 0.01% | 28,077,492 | 0.02% |
| වෙනත් සංස්ථාපිත නොවන ආදායම් බදු | 19,715,447 | 0.17% | 7,061,585 | 0.07% |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බදු | 7,019,723 | 1.43% | 921,091 | 0.01% |
| පොළී මත රඳවා ගැනීමේ බදු | 757,209 | 0.00% | - | 0.00% |
| උපයන විට ගෙවීමේ බදු | 25,794,549 | 0.10% | 28,634,229 | 0.10% |
| **එකතුව** | **1,003,175,923** | **0.18%** | **570,467,573** | **0.09%** |

# පරිච්ඡේදය 6

# ජාත්‍යන්තර සබඳතා

## 6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්

ද්විත්ව බදු සම්මුතීන් හි අරමුණ හා අභිමතාර්ථය වන්නේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් වලදී උපයා ගන්නා ආදායම් ද්විත්ව බදුකරණය අඩු කිරීම හෝ ඉවත් කිරීම හා ආදායම් පැහැර හැරීම වැළැක්වීම වේ. විදේශ ආයෝජන ඇදගැනීමෙහි ලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා යනාදිය ලබාගැනීම පිණිස මග පෙන්වීම වැනි විවිධාකාරයෙන් මෙම ගිවිසුම් විශේෂ කාර්ය භාරයන් ඉටු කරන බැවින්, ඒවා සංවර්ධනය වෙමින් පවත්නා වූ රටවලට බෙහෙවින් සුවිශේෂී වේ.

මෙයට අතිරේක වශයෙන්, ශ්‍රී ලංකාවේ ඇතැම් ගිවිසුම් පාර්ශ්වකරුවන් සමඟ දැනටමත් ඇති කරගෙන ඇති පරිදි, ගිවිසුමකට එළඹෙන රටවල් දෙක අතර සමගිය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ද ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ.

පහත සඳහන් 29 වැනි වගුවේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව 2016.12.31 දින වන විට රටවල් 44 ක් සමඟ ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහු පාර්ශ්වීය ගිවිසුම්වලට එළැඹ තිබේ. ද්විපාර්ශ්වීය බදු ගිවිසුම් හා බහු පාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

වගුව **27 - 2016.12.31** දිනට ද්විත්ව බදු ගිවිසුම් බලපවත්නා රටවල්

| | රට | ගිවිසුම් අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 01 | ඕස්ට්‍රේලියාව | 1989 දෙසැ. 18 | 657/2 | 1991 අප්‍රේල් 08 | 1992/1993 |
| 02 | බංගලිදේශය | 1986 ජූලි 24 | 448/13 | 1987 අප්‍රේල් 07 | 1989/1990 |
| 03 | බහරේන් | 2011 ජූනි 24 | 1847/51 | 2014 ජන. 31 | 2015/2016 |
| 04 | බෙල්ජියම | 1983 පෙබ. 03 | 292/6 | 1984 අප්‍රේල් 09 | 1984/1985 |
| 05 | කැනඩාව | 1982 ජූනි 23 | 253/8 | 1983 ජූලි 13 | 1986/1987 |
| 06 | චීනය | 2003 අගෝ. 11 | 1374/20 | 2005 ජන. 06 | 2006/2007 |
| 07 | චෙකොස්ලොවේකියාව | 1979 පෙබ. 23 | 24/19 | 1979 පෙබ. 23 | 1979/1980 |
| 08 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 1981 දෙසැ. 22 | 228/15 | 1983 ජන. 20 | 1980/1981 |
| 09 | ප්‍රංශය | 1981 සැප්. 17 | 210/17 | 1982 සැප්. 17 | 1982/1983 |
| 10 | ෆින්ලන්තය | 1982 මැයි 18 | 253/8 | 1983 ජූලි 13 | 1981/1982 |
| 11 | ජර්මනිය | 1979 සැප්. 13 | 113 | 1980 ඔක්. 31 | 1982/1983 |
| 12 | හොංකොං (සීමිත) | 2004 මාර්තු 26 | 1374/21 | 2005 ජන. 06 | 2005/2006 |
| 13 | ඉන්දියාව (සංශෝධිත) | 2013 ජන. 22 | 1828/9 | 2013 සැප්. 17 | 2014/2015 |
| 14 | ඉන්දුනීසියාව | 1993 පෙබ. 03 | 789/10 | 1993 ඔක්. 21 | 1995/1996 |
| 15 | ඉරානය | 2000 ජූලි 25 | 1187/16 | 2001 ජූනි 06 | 2002/2003 |
| 16 | ඉතාලිය | 1984 මාර්තු 28 | 322/4 | 1984 නොවැ. 05 | 1978/1979 |
| 17 | ජපානය | 1967 දෙසැ. 12 | 14803/5 | 1968 මැයි 29 | 1969/1970 |
| 18 | කොරියාව | 1984 මැයි 28 | 342/11 | 1985 මාර්තු 29 | 1980/1981 |
| 19 | කුවේටය | 2002 පෙබ. 05 | 1245/19 | 2002 ජූලි 18 | 2002/2003 |
| 20 | මලයාසියාව (සංශෝධිත) | 1997 සැප්. 16 | 1028/21 | 1998 මැයි 22 | 1999/2000 |
| 21 | මොරිෂස් | 1996 මාර්තු 12 | 958/10 | 1997 ජන. 15 | 1998/1999 |
| 22 | නේපාලය | 1999 ජූලි 06 | 1116/6 | 2000 ජන. 26 | 2001/2002 |
| 23 | නෙදර්ලන්තය | 1982 නොවැ. 17 | 281/13 | 1984 ජන. 26 | 1979/1980 |
| 24 | නෝර්වේ (සංශෝධිත) | 1986 දෙසැ. 01 | 464/4 | 1987 ජූලි 27 | 1989/1990 |
| 25 | ඕමානය (සීමිත) | 1994 ජූලි 26 | 881/7 | 1995 ජූලි 26 | 1979/1980 |
| 26 | පකිස්ථානය (සංශෝධිත) | 1981 ඔක්. 15 | 210/17 | 1982 සැප්. 17 | 1983/1984 |
| 27 | පිලිපීනය | 2000 ඔක්. 11 | 1237/7 | 2002 මැයි 21 | 2010/2011 |
| 28 | | | 1256/27 | 2002 ඔක්. 02 | |
| 29 | පෝලන්තය | 1980 අප්‍රේල් 25 | 130 | 1981 පෙබ. 27 | 1984/1985 |
| 30 | කටාර් | 2004 නොවැ. 07 | 1422/10 | 2005 දෙසැ. 05 | 2008/2009 |
| 31 | රුමේනියාව | 1984 ඔක්. 19 | 371/9 | 1985 ඔක්. 15 | 1986/1987 |
| 32 | රුසියාව | 1999 මාර්තු 02 | 1101/22 | 1999 ඔක්. 15 | 2003/2004 |
| 33 | සවුදි අරාබිය (සීමිත) | 1999 දෙසැ. 16 | 1101/23 | 1979 ඔක්. 10 | 1983/1984 |
| 34 | සිංගප්පූරුව | 1979 මැයි 29 | 57/11 | 1984 මැයි 18 | 1977/1978 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 35 | ස්වීඩනය | 1983 පෙබ. 23 | 297/28 | 1984 අප්‍රේල් 09 | 1985/1986 |
| 36 | ස්විස්ටර්ලන්තය | 1983 ජන. 11 | 292/6 | 1989 අගෝ. 18 | 1981/1982 |
| 37 | තායිලන්තය | 1988 දෙසැ. 14 | 571/16 | 1994 ජුනි 23 | 1990/1991 |
| 38 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (සීමිත) | 1992 ජූලි 07 | 824/13 | 2004 ජුනි 21 | 1979/1980 |
| 39 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (පූර්ණ) | 2003 සැප්. 24 | 1346/1 | 1979 නොවැ. 02 | 2004/2005 |
| 40 | එක්සත් රාජධානිය | 1979 ජුනි 21 | 60/23 | 2003 ජූලි 21 | 1977/1978 |
| 41 | අමෙරිකා එක්සත් ජනපදය (සංධානය) | 2002 සැප්. 20 | 1298/8 | 1986 අප්‍රේල් 22 | 2004/2005 |
| 42 | අමෙරිකා එක්සත් ජනපදය | 1985 මාර්තු 14 | 398/4 | 2006 ජූලි 24 | |
| 43 | වියට්නාමය | 2005 ඔක්. 26 | 1455/9 | 2013 නොවැ. 20 | 2007/2008 |
| 44 | සීෂෙල්ස් | 2011 සැප්. 23 | 1837/14 | 2013 නොවැ. 20 | 2015/2016 |
| 45 | බෙලාරුස් | 2013 අගෝ. 26 | 1837/13 | 2013 නොවැ. 26 | 2015/2016 |
| 46 | පලස්තීනය | 2012 අප්‍රේල් 16 | 1838/8 | 2013 නොවැ. 26 | 2015/2016 |
| 47 | ලක්සම්බර්ග් | 2013 ජන. 31 | 1838/9 | 2013 නොවැ. 26 | 2015/2016 |
| | **බහුපාර්ශ්වීය ගිවිසුම1838/9** | | | | |
| 01 | සාර්ක් බහුපාර්ශ්වීය ගිවිසුම | 2005 ඔක්. 13 | 1447/3 | 2006 මැයි 06 | 2011/2012 |

### 6.1.1 **2016 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු**

**ෆින්ලන්තය සමඟ සංශෝධිත ගිවිසුම**

ශ්‍රී ලංකාව සහ ෆින්ලන්තය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම පිණිස ගිවිසුම සංශෝධනය කිරීම සඳහා දෙවන වටයේ සම්මුඛ සාකච්ඡා 2016 අප්‍රේල් මස 25 - 30 අතර කාලය තුළ දී ශ්‍රී ලංකාවේ කොළඹ දී පවත්වන ලදි

**සිංගප්පූරුව සමඟ සංශෝධිත ගිවිසුම**

2014 වසරේ දී රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලද මෙම ගිවිසුම 2016 නොවැම්බර් 16 දින ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලදි.

**ස්විට්සර්ලන්තය සමඟ සංශෝධිත ගිවිසුම**

ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම පිණිස වූ ගිවිසුම සංශෝධනය කිරීම සඳහා පළමු වටයේ සම්මුති සාකච්ඡා 2016 දෙසැම්බර් මස 13 - 16 අතර කාලය තුළ දී බර්නේ (Berne) හි දී පවත්වන ලදි.

**පෝලන්තය සමඟ සංශෝධිත ගිවිසුම**

මෙම ගිවිසුම 2015 ඔක්තෝබර් 06 දින රාජ්‍ය මට්ටමින් අත්සත් තබන ලද අතර, 2016 වසර තුළදී පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ද්විත්ව බදු**

මෙයට අතිරේක වශයෙන්, අනෙකුත් නව සම්මුති / ගිවිසුම් සහ දැනට පවත්නා සම්මුති කිහිපයක් වසර තුළ දී ක්‍රියාවට නංවන ලදි.

තථ්‍ය ආර්ථිකමය යැපීමෙන් බදු පදනම ක්ෂය වීම හේතුකොටගෙන අහිමි වන බදු ආදායමෙන් අනිසි බලපෑම් ඇතිකර වන ශ්‍රී ලංකාව වැනි රටවලට වෙනත් විකල්පයක් නොමැති බැවින්, පදනම ක්ෂය වීම සහ ලාභ විතැන්වීම (BEPS) යටතේ අවශ්‍යතා සහ අනාගතයේ දී බහු පාර්ශ්වික සාධන පත්‍ර (MLT) ඇතුළුව එහි ක්‍රියාවන් සමඟ අනුකූලවීමක් ලෙස දශක කිහිපයකට පෙර එළඹෙන ලද සම්මුති සංශෝධනය කිරීම වඩාත් සුවිශේෂී වේ.

## 6.2 විදේශයන්හි දී අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන්

| වගුව 28 - විදේශයන්හි දී අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වය | | | | |
|---|---|---|---|---|
| අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහන | රට | කාලපරිච්ඡේදය |
| 01 | කේ.දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | වාර්ෂික කළමනාකරණ කමිටු රැස්වීම | අමෙරිකා එක්සත් ජනපදය | 2016.04.11<br>2016.04.15 |
| 02 | කේ.දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | අන්තර්ජාතික මූල්‍ය සංගමයේ ආසියා පැසිෆික් කලාපීය සම්මන්ත්‍රනය (IFA) | කොරියාව | 2016.05.11<br>2016.05.14 |
| 03 | කේ.දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | ආසියානු බදු අධිකාරීන්ගේ සමුළුව | බැංකොක් | 2016.06.06<br>2016.06.09 |
| 04 | කේ.දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර ද්විත්ත බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම සංශෝධනය කිරීම පිණිස යෝජිත සම්මුති සාකච්ඡා | ස්විස්ටර්ලන්තය | 2016.12.11<br>2016.12.18 |
| 05 | ඒ. නදුන් ගුරුගේ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය බලකායේ හමුව සහ මිලපැවරුම් සම්බන්ධ OECD පස්වන විශ්ව සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.04 |
| 06 | ඒ. නදුන් ගුරුගේ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 37 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය - 2016 | බාබඩෝස් | 2016.11.05<br>2016.11.14 |
| 07 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය බලකායේ හමුව සහ මිලපැවරුම් සම්බන්ධ OECD පස්වන විශ්ව සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.04 |
| 08 | පී. රෝහිනී මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 2016 OECD සංසදය | ප්‍රංශය | 2016.05.29<br>2016.06.02 |
| 09 | ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 2016 OECD සංසදය | ප්‍රංශය | 2016.05.29<br>2016.06.02 |
| 10 | ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ආසියානු බදු අධිකාරීන්ගේ සමුළුව | බැංකොක් | 2016.06.06<br>2016.06.09 |
| 11 | එම්.ජී. සෝමචන්ද්‍ර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 37 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය - 2016 | බාබඩෝස් | 2016.11.05<br>2016.11.14 |
| 12 | එම්.එච්.ඩී. මුණසිංහ මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය බලකායේ හමුව සහ මිල පැවරුම් සම්බන්ධ OECD පස්වන විශ්ව සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.04 |
| 13 | කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය බලකායේ හමුව සහ මිල පැවරුම් සම්බන්ධ OECD පස්වන විශ්ව සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.04 |
| 14 | ඩී. රංගල්ල මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ත්‍රෛපාර්ශ්වික අන්තර්ජාතික මූල්‍ය සංගම් රැස්වීම/ හමුව. | ඔස්ට්‍රියා | 2016.04.27<br>2016.05.02 |
| 15 | යූ.බී. වක්කුඹුර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | අන්තර්ගත කාර්ය රාමුව පිළිබඳ මූල්‍ය කටයුතු සම්බන්ධ 92 වැනි කමිටු සැසියේ හමුව සහ වැඩමුළුව | ජපානය | 2016.06.27<br>2016.07.02 |
| 16 | ඩී.එම්.පී. ගනේපොල මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | අන්තර්ගත කාර්ය රාමුව පිළිබඳ මූල්‍ය කටයුතු සම්බන්ධ 92 වැනි කමිටු සැසියේ හමුව සහ වැඩමුළුව | ජපානය | 2016.06.27<br>2016.07.02 |
| 17 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | අහිතකර බදු පරිචයන් පිළිබඳ සංසදයේ හමුව (KHTP) | ප්‍රංශය | 2016.07.03<br>2016.07.09 |
| 18 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර ද්විත්ත බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම සංශෝධනය කිරීම පිණිස යෝජිත සම්මුති සාකච්ඡා | ස්විස්ටර්ලන්තය | 2016.12.11<br>2016.12.17 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | ඩී. රංගල්ල මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | අන්තර්ජාතික මූලය සංගමයේ<br>70 වන හමුව | ස්පාඤ්ඤය | 2016.09.16<br>2016.10.02 |
| 20 | ආර්.එම්. ජයසිංහ මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකය පිළිබඳ<br>කාර්යසාධන හමුව (TFDL) | ප්‍රංශය | 2016.10.04<br>2016.10.10 |
| 21 | ජේ.ඒ.ජී. මහින්දරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකය පිළිබඳ<br>කාර්යසාධන හමුව (TFDL) | ප්‍රංශය | 2016.10.04<br>2016.10.10 |
| 22 | ඊ.එස්. ද සොයිසා මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 37 වන වාර්ෂික තාක්ෂණික<br>සම්මන්ත්‍රණය 2016 | බාබඩෝස් | 2016.11.05<br>2016.11.14 |
| 23 | එම්.එච්. ඩෙන්සිල් මහතා<br>කොමසාරිස් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය<br>බලකායේ හමුව සහ මිලපැවරුම්<br>සම්බන්ධ OECD පස්වන විශ්ව<br>සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.01 |
| 24 | බී.ජේ. ජයරත්න මහතා<br>කොමසාරිස් | බදු සහ සංවර්ධනය පිළිබඳ කාර්ය<br>බලකායේ හමුව සහ මිලපැවරුම්<br>සම්බන්ධ OECD පස්වන විශ්ව<br>සංසදය | ප්‍රංශය | 2016.02.28<br>2016.03.04 |
| 25 | එල්.ආර්. පෙරේරා මහතා<br>කොමසාරිස් | 37 වන වාර්ෂික තාක්ෂණික<br>සම්මන්ත්‍රණය 2016 | බාබඩෝස් | 2016.11.05<br>2016.11.14 |
| 26 | එන්.ටී.ඒ. දිසානායක මෙනවිය<br>කොමසාරිස් | 37 වන වාර්ෂික තාක්ෂණික<br>සම්මන්ත්‍රණය 2016 | බාබඩෝස් | 2016.11.20<br>2016.11.26 |
| 27 | බී. අතුකෝරාල මෙනවිය<br>කොමසාරිස් | 2016 OECD බදුකරණයෙහි ලා<br>ලෝක සබඳතා වැඩසටහන MTC<br>අන්තර්ජාතික එ.අ.බ./භා. හා සේ.<br>බද්ද මාර්ගෝපදේශ | චීනය | 2016.11.20<br>2016.11.26 |
| 28 | බී. හපුතන්ත්‍රී මහතා<br>කොමසාරිස් | 2016 OECD බදුකරණයෙහි ලා<br>ලෝක සබඳතා වැඩසටහන MTC<br>අන්තර්ජාතික එ.අ.බ./භා. හා සේ.<br>බද්ද මාර්ගෝපදේශ | චීනය | 2016.11.20<br>2016.11.26 |
| 29 | ඒ.ඩී.අයි.එස්. අබේසේකර<br>මහත්මිය<br>කොමසාරිස් | අන්තර්ජාතික බදු මගහැරීම -<br>වැඩිදියුණු කරන සහ පොළිය<br>සම්බන්ධයෙන් අවධානය | කොරියාව | 2016.04.24<br>2016.05.01 |
| 30 | එස්.එම්. වික්‍රමාරච්චි මහත්මිය<br>කොමසාරිස් | අන්තර්ජාතික බදු මගහැරීම -<br>වැඩිදියුණු කරන සහ පොළිය<br>සම්බන්ධයෙන් අවධානය | කොරියාව | 2016.04.24<br>2016.05.01 |
| 31 | එච්.ඒ.එල්. රන්ජනී මෙනවිය<br>කොමසාරිස් | අන්තර්ජාතික බදු මගහැරීම සහ<br>BWPS සම්බන්ධ වැඩමුළුව | චීනය | 2016.07.16<br>2016.07.24 |
| 32 | ජී.එච්.එම්. තිලකරත්න මහතා<br>කොමසාරිස් | අන්තර්ජාතික මූල්‍ය සංගමයේ<br>70 වන හමුව | ස්පාඤ්ඤය | 2016.09.23<br>2016.10.02 |
| 33 | එස්.පී. රණසිංහ මහත්මිය<br>කොමසාරිස් | අන්තර්ජාතික මූල්‍ය සංගමයේ (IKA)<br>ආසියා - පැසිෆික් කලාපීය<br>සම්මන්ත්‍රණය | කොරියාව | 2016.05.11<br>2016.05.14 |
| 34 | එම්.ඩී. ආනන්ද සිරි මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | අහිතකර බදු පරිචයන් (FHTP)<br>පිළිබඳ සංසදයේ හමුව | ප්‍රංශය | 2016.07.03<br>2016.07.09 |
| 35 | අයි.වී. ජයරත්න මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | අහිතකර බදු පරිචයන් (FHTP)<br>පිළිබඳ සංසදයේ හමුව | ප්‍රංශය | 2016.07.03<br>2016.07.09 |
| 36 | ඒ.එම්. නෆීල් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර<br>ද්විත්ත බදුකරණය වැළැක්වීම සඳහා<br>ගිවිසුම සංශෝධනය කිරීම පිණිස<br>යෝජිත සම්මුති සාකච්ඡා | ස්විස්ටර්ලන්තය | 2016.12.11<br>2016.12.18 |
| 37 | එස්.ටී. අලව්දීන් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | අන්තර්ජාතික බදු කාරණාවල දී<br>සහයෝගීතාවය සඳහා සමාරම්භක<br>වාර්ෂික සංවර්ධනය වන රටවල<br>සංසදයට ආරාධනය | ඉන්දුනීසියාව | 2016.11.29<br>2016.12.03 |
| 38 | එස්.අයි. සේනානායක මෙනවිය<br>නියෝජ්‍ය කොමසාරිස් | අන්තර්ජාතික බදු මගහැරීම සහ<br>BWPS සම්බන්ධ වැඩමුළුව | චීනය | 2016.07.16<br>2016.07.24 |
| 39 | එස්.අයි. අසන්ති මහත්මිය<br>සහකාර කොමසාරිස් | LHDNM – OECD : Tax Treaty -<br>විශේෂ ගැටළු | මැලේසියාව | 2016.03.13<br>2016.03.17 |
| 40 | කේ.එල්.පී. ධනපාල මහතා<br>සහකාර කොමසාරිස් | LHDNM – OECD : Tax Treaty -<br>විශේෂ ගැටළු | මැලේසියාව | 2016.03.13<br>2016.03.17 |

| | | | | |
|---|---|---|---|---|
| 41 | ඩී.එම්.ජී.එස්.කේ. දිසානායක මහතා<br>සහකාර කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බද්දකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2016.05.08<br>2016.05.28 |
| 42 | එස්.පී.එන්. අමරතුංග මිය<br>සහකාර කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බද්දකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2016.05.08<br>2016.05.28 |
| 43 | යූ.පී.එස්.කේ. ගුණතිලක මෙනවිය<br>සහකාර කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බද්දකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2016.05.08<br>2016.05.28 |
| 44 | එම්.ඒ.සී.ඩී. චන්ද්‍රසිරි මෙනවිය<br>සහකාර කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බද්දකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2016.05.08<br>2016.05.28 |
| 45 | එස්.ඒ.පී.ඩී. දිසාබණ්ඩාර මිය<br>සහකාර කොමසාරිස් | බද්ද ගිවිසුම් සම්මුති සාකච්ඡා සහ අදාළත්වය පිළිබඳ කලාපීය වැඩමුළුව | නේපාලය | 2016.07.10<br>2016.07.14 |
| 46 | සී.ජී. බාලසූරිය මිය<br>සහකාර කොමසාරිස් | බද්ද ගිවිසුම් සම්මුති සාකච්ඡා සහ අදාළත්වය පිළිබඳ කලාපීය වැඩමුළුව | නේපාලය | 2016.07.10<br>2016.07.14 |
| 47 | එස්.ඩී. නිර්මලා දේවි මිය<br>සහකාර කොමසාරිස් | කළමනාකරණය (විගණන) පිළිබඳ අන්තර්ජාතික වැඩසටහන | තායිලන්තය | 2016.07.24<br>2016.08.01 |
| 48 | එම්.ඒ.ඩී. ප්‍රනාන්දු මිය<br>සහකාර කොමසාරිස් | IRBM – OECD : බද්ද ගිවිසුම් පාඨමාලාව අදාළ කරගැනීම සහ සම්මුති සාකච්ඡා පිළිබඳ හඳුන්වාදීම | මැලේසියාව | 2016.09.25<br>2016.10.01 |
| 49 | ජේ.ඒ.ඩී.ටී. මියුරියල් මිය<br>සහකාර කොමසාරිස් | IRBM – OECD : බද්ද ගිවිසුම් පාඨමාලාව අදාළ කරගැනීම සහ සම්මුති සාකච්ඡා පිළිබඳ හඳුන්වාදීම | මැලේසියාව | 2016.09.25<br>2016.10.01 |
| 50 | පී.ඩී. සෙල්වම් මහතා<br>සහකාර කොමසාරිස් | LHDNM – OECD : මිල පැවරුම් ආරවුල් විසඳීම සහ මගහැරීම (MAPS APAS) | මැලේසියාව | 2016.10.23<br>2016.10.29 |
| 51 | ඩබ්.ටී.ඒ. පෙරේරා මෙනවිය<br>සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර ද්විත්ත බද්දකරණය වැළැක්වීම සඳහා ගිවිසුම සංශෝධනය කිරීම පිණිස යෝජිත සම්මුති සාකච්ඡා | ස්විස්ටර්ලන්තය | 2016.12.11<br>2016.12.18 |
| 52 | සී.ජී. බාලසූරිය මිය<br>සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර ද්විත්ත බද්දකරණය වැළැක්වීම සඳහා ගිවිසුම සංශෝධනය කිරීම පිණිස යෝජිත සම්මුති සාකච්ඡා | ස්විස්ටර්ලන්තය | 2016.12.11<br>2016.12.18 |

# පරිච්ඡේදය 7

# ව්‍යවස්ථා සම්පාදනය

## 7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන්

I 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

II 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

## 7.2 අනුමත පුණ්‍යායතන

වර්ෂය තුළදී එක් අනුමැතියක් ලබාදී ඇත.

| පුණ්‍යායතනය | ගැසට් අංකය සහ ලියාපදිංචි දිනය |
|---|---|
| මොරටුව සමාජ සේවා සමාජය (වැඩිහිටි නිවාසය) | 1982/39<br>2016.09.02 |

## 7.3 ගැසට් නිවේදන

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලැබූ අදාළ පනත් යටතේ වර්ෂය තුළදී පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කරන ලදි.

වගුව **29 - 2016** වර්ෂය තුළදී ප්‍රසිද්ධියට පත්කරන ලද ගැසට් නිවේදන

| | ගැසට් අංකය | දිනය | විස්තර |
|---|---|---|---|
| I | 1947/45 | 2016.01.01 | ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ගනුදෙනු කිරීමට අදාළව 107 (2) (ආ) වන වගන්තිය යටතේ අනුමත ගණකාධිකාරීවරුන්ගේ සහතිකය. |
| II | 1947/46 | 2016.01.01 | සරළ කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය ක්‍රියාත්මක කිරීම |
| III | 1947/48 | 2016.01.01 | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ) විධිවිධාන යටතේ 2006.10.05 දිනැති අංක 1465/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද නියෝගයේ උපලේඛනයේ අංක 07 අයිතමය සංශෝධනය කිරීම. |
| IV | 1960/39 | 2016.03.31 | 2013.08.12 දිනැති අංක1823/05 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද නියෝග සංශෝධනය කිරීම පිණිස 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 වැනි වගන්තිය යටතේ 2015.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි සිදු කරන ලද නියෝග |
| V | 1960/42 | 2016.03.31 | 2015.03.25 දිනැති අංක 1907/26 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද දැන්වීමට උපලේඛනයේ "1අ" කොටස සංශෝධනය කිරීම |
| VI | 1991/17 | 2016.11.01 | වෛද්‍ය වෘත්තියෙහි නියුතු වුවනට ගෙවනු ලබන ගාස්තු, වෛද්‍ය උපදේශන ගාස්තු යනාදිය හැර යම් සෞඛ්‍යාරක්ෂක සේවා පිරිවැය 2016.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්ද ආගණනය කිරීමේදී බැහැර කළ යුතු බවට නියම කිරීමේ නියෝගය |
| VII | 1991/35 | 2016.11.02 | ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම |

### 7.4 අර්ථ නිරූපණ කමිටුව

දේශීය ආදායම් පනතේ 208 අ වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2011 වසරේ පත්කරන ලද බදු නීති පිළිබඳ අර්ථ කථනය සඳහා වන කමිටුව (CITL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත වේ. මෙම කමිටුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන පනත්වල විධිවිධාන අර්ථ නිරූපණයන්, පැහැදිලි කිරීම්, මාර්ගෝපදේශ යනාදිය නිකුත් කිරීම සඳහා බැඳී ඇත.

කවර හෝ තැනැත්තෙකුට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලිත පනතක විධිවිධානයන්හි ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් කමිටුවෙහි අර්ථ නිරූපණය ඉල්ලා සිටිය හැකි ය. (කමිටු ලේකම්, ලේකම් අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අර්ථ නිරූපණයන් සහ ක්‍රියාපටිපාටීන්ට අදාළව සමානාත්මතාවය සහතික වනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම කමිටුව වෙත බලය පවරා ඇත. අදාළ වර්ෂය තුළ දී අර්ථ නිරූපණ 38 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි. මෙම කමිටුව මගින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර 33 වගුවෙන් දක්වා ඇත.

**වගුව 30 – 2016 වර්ෂය තුළ දී කමිටුව විසින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර**

| ක්ෂේත්‍රය | ආදායම් බදු | එකතු කළ අගය මත බද්ද | ජාතිය ගොඩනැගීමේ බද්ද | ඉඩම් බද්ද | එකතුව |
|---|---|---|---|---|---|
| ආදායම් බදු බැඳියාව | 3 | 2 | 2 | - | 7 |
| ලාභාංශ | 1 | - | - | - | 1 |
| නිදහස් කිරීම් | - | 2 | 2 | - | 4 |
| සේවා නියුක්ත ආදායම | 1 | - | - | - | 1 |
| සුදුසුකම් ලැබීමේ ගෙවීම් | 1 | - | - | - | 1 |
| ක්‍රියා මාර්ග | - | - | - | 1 | 1 |
| වෙනත් | 3 | - | - | - | 3 |
| **එකතුව** | **9** | **4** | **4** | **1** | **18** |

# පරිච්ඡේදය 8

# අනෙකුත් කාර්යයන්

## 8.1 බදු සේවා අංශය

බදු සේවා අංශය බදු ගෙවන්නන් සහ මහජනතාව වෙත පහසුවෙන් දෙපාර්තමේන්තු සේවා ලබාගත හැකිවන පරිදි පහසුකම් සලසා ඇත. දෙපාර්තමේන්තුවේ නව්‍යකරණ වැඩසටහන් සමඟ, පූර්ණ පහසුකම් රැසක් සැලසීම පිණිස මෙම අංශය ප්‍රතිසංස්කරණය කරන ලදි. ඒ අනුව, මීට පෙර විවිධ අංශ මගින් සිදු කරන ලද ඕනෑම බදු වර්ගයක් ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් මෙම අංශය මගින් සලසා ඇත. උපකාර හෝ තොරතුරු ලබාගැනීම සඳහා පැමිණෙන්නා වූ සෑම තැනැත්තෙකුටම සහයෝගය ලබාදීම පිණිස මෙම අංශයට නිලධාරීන් යොදවා ඇත. අණ පනත්, දෙපාර්තමේන්තු ප්‍රකාශන, ගෙවීම් පත්‍රිකා, ආකෘති පත්‍ර යනාදිය මෙම අංශයෙන් ලබාගත හැකි ය. අදාළ වර්ෂය තුළ දී, බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN) 11,435 ක් මෙම අංශය මගින් නිකුත් කර ඇති අතර, විවිධ බදු වර්ග යටතේ සිදු කරන ලද නව ලියාපදිංචි කිරීම් පහත සඳහන් පරිදි වේ.

| එ.◌.බ. | ස.එ.අ.බ. | එ.අ.බ. තාවකාලික | ජා.ගො.බ. | ආ.බ. | උ.වි.ගෙ. | රැ.බ. | ආ.සේ.ගා. |
|---|---|---|---|---|---|---|---|
| 2,994 | 384 | 29,685 | 29,869 | 3,562 | 1,380 | 438 | 197 |

බදු ගෙවන්නන්ගේ යහපත උදෙසා අත් පත්‍රිකා කිහිපයක් පිළියෙල කිරීමට යෙදුණි. එසේම, බදු ගෙවන්නන් සඳහා බදු උපදේශන සේවා මෙම බදු සේවා අංශය මගින් සලසා ඇත.

## 8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර

| වගුව 31 - දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතික | | |
|---|---|---|
| විස්තරය | 2015 | 2016 |
| **නිකුත් කරන ලද විධානයන්** | | |
| • පොළිය මත රඳවාගැනීම් බදු සඳහා බැංකු වෙත | 144 | 142 |
| **නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකපත්** | | |
| • රට හැර යන තැනැත්තන් සම්බන්ධයෙන් | 396 | - |
| **නිකුත් කරන ලද වරප්‍රසාද කාඩ්පත්** | | |
| • රන් කාඩ් පත් | 411 | 97 |
| • රිදී කාඩ් පත් | 234 | 78 |
| **මෝටර් රථ ආනයනය මත බදු සහන සඳහා නිකුත් කරන ලද සහතිකපත්** | | |
| • සහතිකපත් සංඛ්‍යාව | 299 | - |

## 8.3 මිල පැවරුම් නියෝග අංශය

අදාළ වර්ෂය තුළ දී මිල පැවරුම් ක්‍රමය පිළිබඳව දැනුම වැඩිදියුණු කර ගැනීම සහ විශ්ව මිල පැවරුම් ගැටළු අවබෝධ කරගැනීම පිණිස දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන් නියෝජනය වන පරිදි තෝරාගනු ලැබූ නිලධාරීන් කණ්ඩායමක් සඳහා මිල පැවරුම් නියෝග අංශය මගින් සේවාස්ථ වැඩමුළු 2 ක් සංවිධානය කර ඇත. ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ සහාය ඇතිව නේවාසික වැඩමුළු 3 ක් පසුගිය වසරේ පැවැත්වීම තුළින් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි විය.

දෙපාර්තමේන්තුවේ විවිධ වූ තක්සේරු අංශයන් වෙතින් ලද සිද්ධීන් 13 ක් සඳහා අසම්බන්ධිත මිල නිශ්චය කිරීම මිල පැවරුම් නියෝග අංශයේ නිලධාරීන් විසින් අවසන් කර ඇත.

නව සංවර්ධන සහ නෛතික වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් මිල පැවරුම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපදෙස් මාලාවක් කෙටුම්පත් කර ඇත.

## 8.4 පුහුණු අංශය

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද, පුහුණු වැඩසටහන්වලට අතිරේක වශයෙන් වසර තුළ දී බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් මෙම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් සංවිධානය කරන ලදි.

**වගුව 32 - දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| විෂය | ආයතනය | සහභාගි වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සඳහා අලුතින් බඳවාගන්නා ලද නිලධාරීන් සඳහා වැඩසටහන. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 130 |
| බදුකරණය සම්බන්ධයෙන් ප්‍රායෝගික ගැටළු පිළිබඳ බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන. | නුවරඑළිය | 120 |
| ගිණුම් සහ මූල්‍ය දෙපාර්තමේන්තුවේ, රුහුණු විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය පිළිබඳ වැඩ සටහන. | රුහුණු විශ්ව විද්‍යාලය | 300 |

# පරිච්ඡේදය 9

# ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)

ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාවට නැංවීමේ අභිලාෂය වන්නේ බදු ගෙවන්නන් සඳහා බදු පරිපාලනය සහ බදු අනුකූලතාව පහසු කරලීමයි. එසේම වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් බදු ගෙවන්නන් වෙත සමීපවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ශක්තිය ලබාදීම තුළින් ආදායම් රැස්කිරීම සහ බදු අනුකූලතාවයන් ඉහළ නැංවීම ද එහි අරමුණු අතර වේ.

ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, ඉහළ ඵලදායිත්වයක් ජනනය කරගනු වස් රාජකාරී පරිසරයේ ගුණාත්මකභාවය වැඩි කිරීම සහ ස්වේච්ඡා අනුකූලතාවය වැඩි කිරීමේ පරමාර්ථයෙන් බදු ගෙවන්නන් සඳහා වඩාත් යහපත් සේවාවක් සැලසීම සඳහා බදු දැළ පුළුල් කිරීම සහ අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම එතුළින් අපේක්ෂිත ය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව RAMIS ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූලික පියවර 2013 වසරේ දී ගන්න ලදි. 2014 වසර තුළ දී සමාරම්භක වාර්තාව පිළියෙල කරන ලදුව අවශ්‍යතා එක්රැස් කිරීම වලංගුභාවය සහ ව්‍යාපාරික ක්‍රියාවලිය යළි හැසිරවීම අවසන් කරන ලදි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නව වෙබ් අඩවිය භාෂාත්‍රෙයන් ම 2015 වසරේ දී ප්‍රසිද්ධ කරන ලද අතර එය වැඩිදියුණු කරන ලදුව පළමු අදියර සඳහා පරිශීලකයින් පිළිගන්නා පරීක්ෂණය එම වසරේදී ම නිල වශයෙන් දියත් කරන ලදි.

2016 වසරේ දී RAMIS විසින් තම මෙහෙයුම් ආරම්භ කරන ලදි. RAMIS යටතේ බදු ගෙවන්නා ලියාපදිංචි කිරීම 2016 පෙබරවාරි මස සිට ආරම්භ කළ අතර විද්‍යුත් ලියාපදිංචි කිරීම සඳහා මාර්තු මස සිට පහසුකම් සලසන ලදි. එකතු කළ අගය මත බදු (VAT), ජාතිය ගොඩනැගීමේ බදු (NBT), උපයන විට ගෙවීමේ බදු (PAYE), රඳවුම් බදු (WHT), සංස්ථාපිත බදු (CIT), වලට අදාළ වාර්තා විද්‍යුත් සේවා තුළින් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් බදු ගෙවන්නන් වෙත සලසන ලදි.

RAMIS - ව්‍යාපෘතියේ සඵලත්වය වැඩදියුණු කිරීම පිණිස පද්ධතියේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්, ප්‍රතිලාභ සහ පද්ධතියෙන් අපේක්ෂිත සේවා කෙරෙහි අවධාරණය යොමු කරමින් (සම්පත් දායකයින්) උනන්දුවක් දක්වන්නන්, ප්‍රාදේශීය කාර්යාල සහ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලදි.